2015 ඔබ සැමට ආශිර්වාදවත්

නව වසරක් වේවා

# ලෝකාලෝකය

2014 දෙසැම්බර් / 2015 ජනවාරි

*ඔබ කිතුණුවෙක් ද ?*

*එසේ නම් දිනපතා බයිබලය කියවන්න !*

**ඔබගේ වචනය මාගේ පාදයන්ට පහනක් ය,**
**මාගේ මාවතට එළියක් ය.**

(ගීතාවලිය 119:105)



ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය, 7, විවේකානන්ද පාර, වැල්ලවත්ත, කොළඹ 6.
www.christianfellowshipcentre.com

## රවින්ද්‍ර ජයලත් ඉදිරිපත් කරන

# ගීතිකා පිටුව

හිමි ක්‍රිස්තුස් වැඩියේය
විශ්වයේ තොස් විය
මුලු ලොව රජ වේය
ගි දෙව් සොබා දම
ගී දෙව් සොබා දම
ගී දෙව් ගී දෙව් සොබා දම

මිදුම්කරු වැඩියේය
මිනිස් හඬින් ගී දෙව්
කඳුහෙල් හා ගං හෝ එක් වව්
ගීය ගයන්නට
ගීය ගීය ගයන්නට

විමුත් හිමි වැඩියේය
ශාන්තිය අත් විය
කරුණා උල්පත් ගලයි
සුන් වෙයි පාප මල
සුන් වෙයි සුන් වෙයි පාප මල

හිමි දමින් රජ කරයි
ලෝ සත් දණ නමත්
හිමි යාපත් කම තෙදැත්
පෙම වෙයි විස්ම පත්
පෙම වෙයි විස්ම පත්
පෙම වෙයි පෙම වෙයි විස්ම පත්

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
|---|---|---|---|---|---|---|---|
| ස̇ | - | නි | - | ධප | - | - | ම |
| ධ | ධ | ධ | ධ | නි | නි | නි | නි |
| ස̇ | නි | ධ | ප | ප | පම | ග | - |
| ග | - | - | - | ගම | ප | - | - |
| ගරි | ස | ස̇ | - | ධ | ප | පම | ග |

| 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 |
|---|---|---|---|---|---|---|---|
| ග | ග | රි | රි | ස | - | - | ප |
| ස̇ | - | - | - | ස̇ | ස̇ | ස̇ | ස̇ |
| ස̇ | ස̇ | නි | ධ | ප | ප | පම | ග |
| මග | රි | - | - | රිග | ම | - | - |
| ම | ග | - | රි | - | ස | - | - |

නත්තල් දින පෙ.ව 9.00
අප මධ්‍යස්ථානයේ පැවැත්වෙන
රොටි කැඩීමේ හා නමස්කාර
මෙහෙයට සහභාගි වී අර්ථාන්විතව
ස්වාමි වු යේසුස්වහන්සේ සිහිකරන්න !

# බදු නිළධාරියා ගස් නඟියි



මෙම කතා පුවත බයිබලයේ ලුක් පොතේ 19 වැනි පරිච්ඡේදයේ සඳහන්ව ඇත. අපගේ ස්වාමී වූ යේසුස්වහන්සේගේ සේවය කරණකොටගෙන මිහිපිට සිදු වූ හාස්කම් අතරින් කැපී පෙනෙන සිදුවීමකි. මක්නිසාද පාපකාරී ජීවිතයක් ගත කල පුද්ගලයෙක් ඇතුලාන්තයෙන් වෙනස් වූ ආකාරය මෙහි මනාවට ශුද්ධාත්මයාණන්වහන්සේ අපට පෙන්වා දෙයි.

ඔහු නමින් සාකෙවුස්ය. රැකියාව රාජ්‍ය බදු නිළධාරියකි. ඔහුට වත් පොහෙසත්කමින් හෝ නිළබලයෙන් අඩුවක් නොවීය. තරමක් මිටි ශරීරයක් සහිත ධෛර්යවන්න පුද්ගලයකු විය.

මනුෂ්‍යන් අතර සැර පරුෂ හා පව්කාර චරිතයක් ඇති පුද්ගලයකු ලෙස ප්‍රසිද්ධව සිටි බව සඳහන් වේ. තවද ඔහු අසාධාරණ ලෙස බදු අය කළ බවද මෙම කතාව කියවන විට අපට හැඟේ. පවුලේ විස්තර කිසිවක් සඳහන්ව නැතත් ඔහුට නිවසක් තිබූ බව සඳහන් වේ. මේ අකාරයෙන් ඔහු ජීවිතය ගෙන යන අතරේ දවසක් එම නගරයට යේසුස්වහන්සේ පැමිණියහ. මෙම ආරංචිය සාකෙස්වුගේ කන වැටුණි. ඔහු වහාම උන්වහන්සේ දැක බලා ගැනීමට ඒ දෙසට ගමන් කළේය. නමුත් යේසුස් වහන්සේ දැක ගැනීමට ඔහුට බධා රාශියකට මුහුණ දීමට සිදු විය. ඒ බධා මෙනවාද? ඔහු ඒවා ජයගත්තේද? මෙම චරිතය පිළිබඳ අපි ටිකක් සොයා බලමු.

## 1. යේසුස්වහන්සෙ කවුද කියා බලන්ක සෙවීය - ලෝකයේ සාමන්‍ය ක්‍රමය

ඔහුට යේසුස්වහන්සේ කවුද කියා බලන්න සිතුණා විය හැක. ඒ නිසාවෙන් උන්වහන්සේ දැක ගැනීමට උත්සාහ කලේය. මෙයින් අපට මතක් කර දෙන්නේ සමාන්‍ය ලෝකයේ පිළිවෙලයි. මක්නිසාද හැම දෙයක්ම දැන ගැනීමට, දැක ගැනීමට හා තොරතුරු දැනග ැනීම අප තුළ නිතැතින්ම අසාවක් පවතී. ඒ අකාරයෙන් යේසුස්වහන්සේ දැක ගැනිමට හා දැන ගැනීමට බෝහෝ අය පැමිනෙණ අතර ඉන් එහාට උන්වහන්සේ සමග සම්බන්ධතාවයක් ඇති කර ගන් නැතිව ආපසු හැරී යයි. තමන්ට තිබෙන සියලුම ප්‍රශ්නවලට විසඳුම යේසුසවහන්සේ බව වැඩි දෙනෙකු නොදැන සිටීම මහත් අභාග්‍යයකි. සාමාන්‍ය මනුෂ්‍යය ක්‍රමයෙන් හා ලෝකාකාර පිළිවෙල්න් මීදී ලෝකයේ ඇස් වලින් නොව ඔබගේම හදවතින් යේසුස්වයන්සේ දැක ගන්න. එවිට උන්වහන්සේගේ මහත් ආශිර්වාද ඔබටත් භුක්ති විදීමට හැකිවේ.

## 2. මිටි බැවින - ජන්මික ස්භාවය

යේසුස්වහන්සේ දැක ගැනීමට සාකෙවුස් කොතරම් උත්සාහ කලත් ඔහුගේ මිටිභාවය බදාවක් විය. අවට මහත් සෙනඟක් රැස්ව සිටි අතර සාකෙවුස්ට වඩා අන් අය උසින්

වැඩි බැවින් ඔහුට යේසුස්වහන්සේ දැකගැනීමට නොහැකි විය, සාකෙවුස් උපතින්ම මිටිය. මෙයින් අපට ශුද්ධාත්මයාණන්වහන්සේ අපට පෙන්වා දෙන්නේ යේසුස්වහන්සේ වෙතට අපට ලඟාවීමට බලපාන බාධකයක් වන්නේ ජන්මයෙන්ම අපට හිමි වන දේය. ශරීරික ස්භාවය අද කිසිම බාධාවක් නොවේ. නමුත් අපගේ ආගම, ජාතිය. පරම්පරාව. තත්වය. නෑදෑ බැදීම්, සිරිත් විරිත් වැනි දේ උන්වහන්සේ සැබෑ ලෙස හඳුනා ගැනීමටත් අදහාගැනීමටත් මහත් බධාවක් ලෙස අප ඉදිරියට පැමිණේ. සාමාන්‍ය මනුෂ්‍යා ජන්මික බැදීම්වලින් හා පිළිවෙලින් මිදී ඔබේ පවුලේ අයගේ, මිතුරන්ගේ. අසල්වාසීන්ගේ නෑදෑයින්ගේ බධා නැමැති ඇස් වලින් නොව ඔබගේම හදවතින් යේසුස්වයන්සේ දැක ගන්න. එවිට උන්වහන්සේගේ මහත් ආශිර්වාද ඔබටත් භුක්ති විදීමට හැකිවේ.

### 3,සමූහයා නිසා - සමාජ බලපෑම.

සාකෙවුස් උසස් නිළධාරියෙක් වුවත්, අන් අය ඔහුට යේසුස්වහන්සේ දැක ගැනීමට ඉඩ ලබා දුන්නේ නැත. සෙනඟ ඔහුට මහත් බධාවක් විය. මෙයින් අපට පෙන්වා දෙන්නේ යේසුස්වහන්සේ හඳුනාග ැනිම හා අදහාගැනීමට සමාජය අපට අතිකරන බාධාය. සමාජය පුරුදු වී අත්තේ ගතානුගතික ක්‍රමයටය. එහෙත් යේසුසවහන්සේ මනුෂයාට පෙන්වා දෙන්නේ අලුත් මාර්ගයකි. එම මාර්ගය පිළිගැනිමට හෝ ඒ දෙස බැලීමටවත් සමාජය සුදානම් නැත. එම මාර්ගය පිළිගන්න අය මෙම සමාජයේ බිල්ලක් බවට පත්වේ. එතරම් මෙම සමාජක්‍රමය ප්‍රබලය. යේයුස්වහ්සේ වෙත එන අයට විවිධ බලපෑම් සමාජය ඇති කරයි. නිනිදාව. කොන්කිරීම. හයකිරීම. තනිකිරීම. කනත්ත නොදීම. පැසැල් නොලැබීම. වැනි මහත් බලපෑම් , එහෙත් සාමාන්‍ය සමාජීය ක්‍රමයෙන් හා බලපෑම් වලින් මිදී ඔබගේම හදවතේ නිර්භීතකම හා සැලසුම් සහගතව යේසුස්වයන්සේ දැක ගන්න. එවිට උන්වහන්සේගේ මහත් ආශිර්වාද ඔබටත් භුක්ති විදීමට හැකිවේ.

.

### 4, සුංගම් අයකරන්නගෙන් ප්‍රධානියා.- නිළමය තත්වය හා සමාජ තරාතිරම

මොහු සමාජයේ කැපී පෙනෙන පුද්ගලයකු වූ බැවින් ඔහු පිළිබඳ හැම කෙනෙකුගේම නිතර අවධානයට ලක්වන්නට ඇත. මෙම තත්තවය හැම ජනප්‍රිය පුද්ගලයකුගේම පුද්ගලිකත්වයට තර්ජනයකි. තමන්ගේ සමාජ තරාතිරම යේසුසවන්සේගේ ප්‍රේමය අත්දැකීමට හැම විටම බධාවකි. වර්තමානයේදීද මෙම තත්වය එසේමය. බලන්න මැති ඇමතිවරුන් ඉහල රජ්‍ය නිලධාරීන් මේ අයගේ ජිවිත යම් රාමුවකට කොටු වී ඇත. ඒ ඔවුන්ගේ නිළතත්වය නිසාවෙනි. මොහොතකට ඔබගේ තරාතිරමෙන් මිදී ඔබගේම හදවතේ නිර්භීතකම හා චාම් ගුණයෙන් යුක්තව යේසුස්වයන්සේ දැක ගන්න. එවිට උන්වහන්සේගේ මහත් ආශිර්වාද ඔබටත් භුක්ති විදීමට හැකිවේ.

### 5, සාකෙවුස් නම් පොහොසත් මනුෂ්‍යයෙක්, - වත්පොහොසත්කම හා ගතානුගතික ස්භාවය.

යේසුස්වහන්සේගේ ප්‍රේමය හා ආශීර්වාද භුක්තිවිදීමට වත්පොහොසත් කමද බධාවකි. ඊට ප්‍රධානම හේතුව වන්නේ පොහොසත්

බෝහෝ අයගෙ ඇදහිල්ල හා ආරක්ෂාව තබා තිබෙන්නේ තම ධනය මතය. ඔවුන්ට දෙවියන්වහන්සේගේ පිහිටක් අවශ්‍ය නොවේ. ඔවුන්ගේ දෙවියෝ මුදල්ය. ඔවුන් ආගම අදහන්නේ විලාසිතාවකටය.(හැමෝම නොවේ). නමුත් ඔබගේ වත්පොහෝසත්කම නිසාවෙන් ඔබව පාපයෙන් නිදහස් කිරීමට හැකි එකම ජීවමාන, ප්‍රේමවන්ත ගැලවුම්කරුවාට ජීවිතය නොදී සිටින්නට එපා. සාදාකාල විනාශයෙන් ඔබට ගළවන්නට ඔබගේ මුදල් හෝ වෙනයම් ධන සම්පතකට නොහැකිය. ඔබගේ පොහොසත්කම වරදක් හෝ පාපයක් නොවේ. නමුත් එය යේසුස්වහන්සේ අනුග මනය කිරීමට බාධාවක් කර ගන්න එපා.

## මෙම සාකෙවුස්ගේ ගැලවීම උදෙසා දෙවින්වහන්සේගේ සැලසුම

### 1,ගහකට හනික නැගීම - ශුද්ධාත්මයාණනන්ගේ අභිරහස්මය ක්‍රියාව.

සාකෙවුස්ට කොතරම් බාධා පැමිණියත් ඔහු තම උත්සහාය අත්හැරියේ නැත. ඔහු සැලසුම් සහගතව ක්‍රියා කලේය. යේසුසවහන්සේ යන්නට සිටි මාර්ගය කෙසේ හෝ දැනගෙන ඔහු කලින් එම මාර්ගයට ගොස් එහි තිබු ගහකට නැගුණු සේක. බලන්න මෙහි තිබෙන ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියාව. ඔහුගේ තත්වය, නිළය, පොහෙසත්කම යන ආදී සෑම දෙයක්ම අත්හැර ගහකට නැගීම පිටුපස තිබෙන්නේ දෙවින්වහන්සේගේ සැලසුම හා ශුද්ධාත්මයාණන් වහන්සේගේ ක්‍රියාව මිස අන් කිසිවක් නොවේ. යම් කෙනෙකු දෙවියන්වහන්සේගේ දරුවකු බවට පත්වීම උන්වහන්සේගේම ක්‍රියාවක්ය. ඔබට උන්වහන්සේ කතා කරන විට, ඔබගේ සිතට බලපෑමක් , පෙළඹවීමක් යේසුසවහන්සේ පිළිබඳ ඇතිවන විට ඔබගේ සිත තද කර ගන්න එපා, බයිබලය කියවන්නට, සභාවකට යන්නට, දේව සේවකයකු සමග කතා කිරීමටද යම් ස්ථානයක් පැවැත්වෙන රැස්වීමකට යන්නට ඔබගේ හදවතට අසාවක් . අවශ්‍යතාවයක් , පෙළඹවීමක් ඇති වුවහොත් එය මරා නොදමන්න. විවිධ නිදහසට කරුණු නොකියන්න. ලජ්ජාවට හෝ බියට පත් නොවන්න. බාධා නොවන්න. ඔබගේ හැඟීමට ඉඩ දෙන්න. මෙවැනි බලපෑම් අපට ඇති කරන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේය. එහි කෙළවර මහා ආශ්‍රවාදයක් තිබිය හැක. ඔබත් ශුද්ධාත්මයාණන්වහන්සේට ඔබගේ ජීවිතයේ ක්‍රියාකිරීමට ඉඩ දෙන්න.

### 2, සේසුවහන්සේ එතැනට පැමිණීම හා උඩ බලා සාකෙවුස්ට කතා කිරීම, - පුද්ගලික දිව්‍ය කැඳවීම

සාකෙවුස් ගස උඩ සිටින බව එතැන සිටි කිසිවෙක් දැන සිටියේ නැත. එහෙත් යේසුස්වහන්සේ දැන සිටියසේක. උන්වහන්සේ එම පාරේ ගමන් කරන අතරේ එම ගස ලග නැවති උඩ බලා සාකෙවුස්ට ගසෙන් බසින ලෙස කීවේය. එවිට අවට සිටි පිරිසද උඩ බලන්න ඇත. සාකෙවුස් මහත් අපහසුතාවයටත් ලජ්ජාවටත් පත් වන්නට ඇත. ඔහු හනික ගසෙන් බැස්සේය. සාකෙවුස් හා යේසුස්වහන්සේ මුණගැසුනේ ඒ ආකාරයටය. මෙය දිව්‍ය කැඳීවීමයි. යේසුස්වහන්සේ පව්කාරයන් කැඳවන සේක. උන්වහන්සේ පව්කාරයන්ගේ මිත්‍රයා බව බයිබලය පවසයි.

(ලූක් 7:34–)( මතෙව් 11:19). සියලු පව්කාරයන්ගේ. නරක මිනිසුන්ගේ. සමාජය එපාකල, පිළිකුල් කල . ජිවිතය එපා වුන. හොද- නරක සියලු දෙනාගේ මිත්‍රයා යේසුස්වහන්සේය. උන්වහන්සේ ඕනෑම පව්කරුවකුට සමාව දෙන සේක. ලෝකයා දකින්නේ අපගේ පිටාර පෙනුමයි. අපගේ අතුලාන්තය හරියටම දකින්නේ යේසුස්වහන්සේය. හැම කලු වලාකුලකම තිබෙන රිදී රේඛාව දකින. එය අගය කරන ඒ සෙනෙහවන්ත පුද්ගලයා යේසුස්වන්සේය. ඔබගේ සමාජ දර්ශකය ( අන් අය ඔබ ගැන සිතන පතන ආකාරය) කුමක් වුවත් ඒ ගැන අමතක කර යේසුස්වහන්සේගේ ආරධනාව පිළිගෙන උන්වහන්සේ ඔබගේ ජිවිතයට පිළිගන්න. උන්වහන්සේගේ අනුග්‍රහය භුක්ති විදින්න.

## 3.නුඹේ ගෙදර අද මා නවතින්නට ඕනෑය - අප තුළ වාසය කරන ආත්මයාණෝ

යේසුස්වන්සේගේ ඉහත ප්‍රකාශයත් සමගම සාකෙවුස්ගේ මෙන්ම අවට සිටි සියල්ලගේ යේසුස්වහන්සේ පිලිබද සිතිවිලි සියල්ල වෙනස වන්නට ඇත. සාකෙවුස්ගේ සිත ප්‍රීතියෙන් පිනා යන්නට ඇත. සියලු දෙනා මාව ප්‍රත්ක්ෂේප කරන විට මේ පුද්ගයා විතරක් මාව පිලිගන්නේ ඇයි යන ප්‍රශ්නය මතු වන්නට ඇත. අවට සිටි අයටද නොයෙකු ප්‍රශ්න තම සිත තුළ මතුවන්නට ඇත. නමුත් සියල්ල වෙනස් වන්නට පටන් ගෙන ඇති බවනම් සාකෙවුස්ට තෙරුම් යන්නට ඇත. යේසුස්වන්සේ පව්කාරයන්ගේ අසමත්ජාතීන්ගේ පිවිතය නැමැති ගෙදරට අතුල්වීමට ඉතා අසාකරයි. උන්වහන්සේ ඔවුනට ප්‍රේමකරයි. ඔවුන්ගේ ජීවිත වෙනස් කරන අතර සදාකාල ජීවනයද ලබා දෙයි. ඔබත් යේසුස්වහන්සේට ඔබගේ හදවත නැමති ගෙදර දොර විවෘත කර උන්වහන්සේ ඔබගේ හදවතට පිළිගන්න (එළිදරව් 3:20),

## 4. සාකෙවුස් වහාම ගසෙන් බැස ප්‍රීතියෙන් යේසුස්වහන්සේ පිළිගත්තේය - දෙවියන්වහන්සේගේ දීමනාව

සාකේවුස්ට මොනතරම් ලජ්ජාවක්, හෝ පීඩනයක් තිබුණත් යේසුස්වහන්සේගේ හඬ ඇසූ සැනින් ගසෙන් බැස උන්වහන්සේ ළඟට පැමිණ උන්වහන්සේ පිළිගත්තේය. මෙය සැබෑ වෙනසකි. යම් කෙනෙකු ඇතුලාන්තයෙන් වෙනස් නොවන්නේද එම පුද්ගලයාට නව මිනිසකු බවට පත් වීමට නොහැක. යම් කෙනෙකු ඇතුලාන්තයෙන් වෙනස් කරන්නට පුලුවන් වන්නේ දෙවියන්වහන්සේට පමණී. මෙය දෙවියන්වහන්සේගේ දීමනාවකි. ගැලවීම දෙවියන්වහන්සේගේ දීමනාවකි. (රෝම 6:23). පව්කාරයන්ට හිමි සදාකාල මරණය නොහොත් සදාකාල විනාශයයි. යේසුස්යහන්සේ පිළිගන්න, අදහන අයට දෙවියන්වහන්සේ සදාකාල ජීවනය නොහොත් අමාමහා සැපත නොමිලේම දීමනාවක් හැටියට ලබා දේ. ඔබත් යේසුස්වහන්සේව ඔබගේ ජීවිතයට පිළිගෙන අමා මහා සැපත හිමිකර ගන්න.

7 වන පිටුව බලන්න

### 5, "මා සන්තක දෙයින් දෙකෙන් කොටසක් දිළිඳුන්ට දෙමි. අයුත්තේ යමක් ගෙන තිබේ නම් ඔහුට සතර ගුණයක් නැවත දෙමියි" - නැවත උත්පාදනය ලැබීම

මෙතෙක් කල් දුප්පත්තුන්ගෙන් බලෙන් උදුරා ගත් මේ පුද්ගලයා දැන් දුප්පත් අයට බෙදා දෙන්න අරම්භ කරයි. අයුතු ලෙස තම නිළ බලය උපයෝගි කරගෙන අය කර ගත් අයට දැන් ඒ වගේ සතර ගුණයක් දෙන්න යයි. මේ වෙනස සාකෙවුස් තුළ ඇති වුයේ කෙසේද? ඔහු සිතන අකාරය වෙනස් වී ඇත. ඔහු අභිලාශයන් වෙනස් මාර්ගයක ගමන් කරන්නට පටන් අරන් ඇත. සාකෙවුස් නැවත ඉපදීම ලබා ඇත. එසේ වුයේ කෙසේද? යේසුස් වහන්සේගේ වචනය හා දෙවියන්වහ්සේගේ අභිරස් ක්‍රියාව කරණකොටගෙනය. සාකෙවුස්ගේ ඇතුලාන්තය වෙනස් වු සැනෙන් එය ක්‍රියාවෙන් ප්‍රදරශනය විය. ඔබත් එබගේ ජීවිතය වෙනස් කර ගන්න යත්න දරන අයෙක්ද? අලුත් වෙන්න උත්සහ කරන අයෙක්ද? තවම හරිගියේ නැද්ද? එන්න යේසුස්වහන්සේ වෙත, උන්වහන්සේගේ වචනය විශ්වාස කරන්න. කීකරුවන්න . ශුද්ධාත්මයාණවහන්සේට ඔබගේ ජීවිතයේ ක්‍රියා කරන්න ඉඩ දෙන්න, එවිට සැබෑ වෙනසක් ඔබගේ ජීවිතයට උරුමවෙයි. ඔබගේ ජිවිතය මුලුමනින්ම වෙනස් වේ. එය කල හැක්කේ යේසුස්වහන්ටේ පමණී.

**සංස්කාරක - එස්. මෙත්තානන්ද - 077 8813197**

## මෙය විශ්වාස කරනවා නම් සැබවින් ඔබ වාසනාවන්තයෙක් !

මේ ලොකයේ සිටිනා වාසනාවන්තම පුද්ගලයා මම යැයි මට කිව හැකියි. පොහොසත්, සදාකාලික ප්‍රීතියෙන්ද, සම්පූර්ණ විශ්වාසයෙන්ද ආශිර්වාදලත් තැනැත්තා මමය. මෙම ලස්සන ලෝකයෙහි මා අත්විදින ප්‍රීතිය සහ සතුට කියා නිම කළ නොහැකිය.

ලෝකයේ අන් සෑම කෙනෙක්ම ඉපදෙන ආකාරයට මමත් පව්කාරයකු ලෙස මේ ලෝකයට ඉපදුනී. **"සියල්ලෝම පව් කොට දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීනව සිටිති යැයිද පාපයේ කුලිය නම් මරණයය, නුමුත් දෙවියන්වහන්සේගේ දීමනාව නම් සදාකාල ජීවනයය"** යැයිද දේව වචනය පවසයි. උදාහරණයකට, ඔබ මුළු ලොවම සතු කර ගත්තා විය හැකියි. **"යම් මනුෂ්‍යයෙක් මුළු ලෝකය ලබාගත්තත් තමාගේ ජීවිතය නැති වුනොත් ඔබට මොන ලාභයක්ද? නොහොත් මනුෂ්‍යයෙක් තමාගේ ජීවිතය වෙනුවට හුවමාරුකර දෙන්නේ කුමක්ද? මනුෂ්‍ය පුත්‍රයා තමන් පියාණන්වහන්සේගේ තේජසින් යුක්තව තම දූතයන් සමග එන්නේය. එකල උන්වහන්සේ එකිනෙකාට තම තමාගේ ක්‍රියා ලෙස විපාක දෙන සේක. සැබවින් නුඹලාට කියමි: මනුෂ්‍ය පුත්‍රයා ස්වකීය රාජ්‍යයෙන් යුක්තව එනවා දකින තෙක් මෙහි සිටින්නන්ගෙන් සමහරෙක් කිසිසේත් මරණ රසය නොවිඳින්නෝ"** යැයි ශුද්ධාත්මයාණන්වහන්සේ බයිබලයේ පවසයි (මතෙව් 16:26-28). මෙයින්, මගේ මේ ප්‍රකාශය කියවන්නාවු ඔබ සැමට මම ප්‍රකාශකරන්නේ, මම පව්කරුවෙක් ලෙස උපත ලැබුවා පමණක් නොවේ මා වැඩිහිටියකු ලෙස දින දින වර්ධනය වන විටදී මගේ ජීවිතයේ පුරාවටම මම පව් කරමින් සිටියෙමි. යේසුස්වහන්සේව පිළිග න්නා තුරු. එදින පටන් මා බයිබලය ඉගෙනගන්නෙක්ව, සභාවට යමින් එහි සිටියාවු සභාපාලකයින්

22 වන පිටුව බලන්න

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ යාච්ඤා ජීවිතය,



යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ යාච්ඤා ජීවිතය පිළිබඳ මීට පෙර සඟරා කලාප කිහිපයකමදීම සාකච්ඡා කල අතර මෙම කලාපයේදීද එහි එක් පැතිකඩක් පිළිබඳ බලමු, කිතුණුවන්ට ඇති පරම යාච්ඤා ආදර්ශය යේසුස්වහන්සේය. උන්වහන්සේ යාච්ඤාව පිළිබඳ බොහෝ කාරණා අපට උගන්වන සේක. අපි යාච්ඤා කිරීමට යේසුස්වහන්සේගෙන් ඉගෙන ගනිමු.

## යේසුස්වහන්සේ සඳහන් කල යාච්ඤා ඉල්ලීම්

තම ගෝලයන්ට උන්වහන්සේ මෙසේ යාච්ඤා කරපල්ලා හෝ මේ ගැන යාච්ඤා කරපල්ලා යැයි පැවසූ සේක. එනම් නිශ්චිත කාරණා පෙන්වා දුන් සේක. එවැනි යේසුස්වහන්සේ සඳහන් කල යාච්ඤා ඉල්ලීම් කිහිපයක් සලකා බලමු.

**1, පීඩා කරන්නන් උදෙසා යාච්ඤා කරපල්ලා (මතෙව් 5:44),**

**2, ගොයම් කැපීමට ගොවියන් එවන ලෙස ගොයමේ ස්වාමියාට යාච්ඤා කරපල්ලා (මතෙව් 9:38/ ලූක් 10:2)**

**3. නුඹලාගේ පලා යෑම ශීත කාලයකවත් සබත් දවසකවත් නොවන ලෙස යාච්ඤා කරපල්ලා ( මතෙව් 24:20/ මාර්ක් 13: 18-19)**

**4, නුඹලා පරීක්ෂාවට නොපැමිණෙන පිණිස අවදිව හිඳ යාච්ඤා කරපල්ලා (මතෙව් 26:41/මාර්ක් 14:38/ ලූක් 22:40/ ලූක් 22:46)**

**5, උන්වහන්සේද, යාච්ඤාවෙන් මිස වෙන ආකාරයකින් මේ ජාතිය දුරුකරන්ට නුපුලුවනැයි කී සේක. (මාර්ක් 9:29)- යක්ෂ ආත්ම දුරුකිරීම පිණිස යාච්ඤා කිරීම**

**6, ඒ කාලය කවදා වේදැයි නුඹලා නොදන්නා බැවින් අවදිව ඉඳ යාච්ඤා කරපල්ලා (මාර්ක් 13:33/ ලූක් 21:36)**

**7, නුඹලාට නින්දාකරන්නන් උදෙසා යාච්ඤා කරපල්ලා ( ලූක් 6:28)**

ඉහත සඳහන් ඉල්ලීම් දෙස හොඳින් බැලූ විට අපගේ යාච්ඤා ඉල්ලීම් වලට වඩා උන්වහන්සේගේ ඉල්ලීම් වෙනස් බව ඔබට පෙනේවී. එබැවින් ඒ ගැන සිතා එක් එක් කාරණය පිළිබඳ හොඳින් මෙනෙහිකරන්න. ඔබත් මෙම කාරනා ගැන යාච්ඤා කිරීමට සිතට ගන්න. මක්නිසාද ස්වාමින්වහන්සේ සඳහන් කල මෙම කරාණා වල අර්ථය අති ගැඹුරුය. මෙම කාරණා තෙරුම් ගැනීමටත්, ඒ අනුව යාච්ඤා කීරීමටත් ශුද්ධාත්මයාණන්වහන්සේ අපට සැමට උපකාර කරන සේක්වා !

**ගුරුහරු**

# දේව භය ඇති දරුවන් ගොඩනැගීම

කිතුණු දෙමව්පියන් වීම විශාල අභියෝගයක් වුවද එය මහත් වරප්‍රසාදයකි. විශේෂයෙන්ම යොවුන්වියේ සිටින දරුවන්ව කිතුණු වටිනාකම් තුළ ශක්තිමත්ව ගොඩනැගීම සම්බන්ධයෙන් ඔබ දන්නා පරිදි නොයෙකුත් බාධාවන් ඔබ අත්දකිනවා වියහැක. එවැනි බාධා තිබුණද දෙවියන්වහන්සේ දන්නාවූ දේවභය ඇති මේ ලෝකයට ආලෝකයක් වියහැකි යොවුන්වියේ දරුවන් ගොඩනැගීම ඔබට කළහැක. ඒ සඳහා ඔබට උපකාර වියහැකි කරුණු කිහිපයක් මෙම ලිපිය මගින් ඉදිරිපත් කිරීමට හැකිවීම පිළිබඳව මම දෙවියන්වහන්සේට ස්තුති කරමි.

දෙවියන්වහන්සේ ගැන ඔබට තිබෙන විශ්වාසය පිළිබඳව ඔබේ යොවුන්වියේ දරුවන් සමඟ බෙදාගන්න.

ඔබ නොකඩවා සභාවට යාම සහ නමස්කාර කිරීම ඔබේ යොවුන්වියේ දරුවා තුළ ඇදහිල්ල ගොඩනැගිය හැකි ඉතාමත් අපූර්ව දෙයකි. නමුත් මෙය එකම දෙය නොවේ. දෙවියන්වහන්සේ පිළිබඳ ඔබගේ පෞද්ගලික විශ්වාසය ගැන ඔබේ යොවුන්වියේ දරුවා සමඟ කථාකිරීම සහ සාකච්ඡා කිරීම මගින් ඔබේ දරුවා තුළද ස්වාමීන්වහන්සේ සහ ගැළවුම්කරු කෙරෙහි පෞද්ගලික සහ ශක්තිමත්වූ බැඳීමක් ඇතිකරනු ඇත. ඔබ දිනපතා දෙවියන්වහන්සේව අත්දකින ආකාරය පිළිබඳව දරුවන් සමඟ කතාකරන්න. ඔබට ඇතිවන සැකයන් හෝ ප්‍රශ්න පිළිබඳව සහ ඒවාට කිතුණු ඇදහිල්ලේ තිබෙන සත්‍යතාවයන් ගැන සහ ඇදහිල්ල පිළිබඳව දිනපතා සෘජුව පවුලේ කතා කරන්න. එවිට ඔබ මෙන්ම ඔබගේ දරුවන්ද ඇදහිල්ලෙන් වර්ධනය වනු නියතය.

දෙමව්පියන් ලෙස අප සැමගේ ඉමහත් ආශාව වනුයේ අපගේ දරුවන් දේවභය ඇතිව ක්‍රිස්තුස්වහන්සේ තුළ වර්ධනයවීම සහ සමාජයේ ගෞරවය ලබන්නාවූ පුද්ගයන් බවට පත්වීමයි. දෙවියන්වහන්සේගේ ආශාව වනුයේද දරුවන් උන්වහන්සේට ප්‍රේම කිරීම සහ උන්වහන්සේ පිළිබඳව දැනගැනීමයි. එමෙන්ම උන්වහන්සේගේ කැමැත්ත වනුයේ ඔවුන් සමාජයේ සම්පූර්ණ "ප්‍රීතිය" භුක්ති විඳිමින් වර්ධනය වීමයි. නමුත් අප මතක තබාගත යුතුයි දේව වචනයේ මෙම "ප්‍රීතිය" භුක්ති විඳිමට කොන්දේසියක් එකතුකර තිබෙනබව. එනම්, **"තරුණය නුඹේ යෞවන වයසේදී ප්‍රීතිවෙයන්න, නුඹේ යෞවන දවස්වල නුඹේ සිත නුඹ සන්තෝෂ කෙරේවා. නුඹේ සිතේ මාවත්වලත් නුඹේ ඇස්වලට පෙනෙන ලෙසත් හැසිරියන්න. නමුත් මේ සියල්ල ගැන දෙවියන්වහන්සේ නුඹව විනිශ්චයට පමුණුවන බව දැනගනින්න" (දේශනාකාරයා 11:9)**

අද අප ජීවත්වන සමාජය දෙමව්පියන්ව භීතියට පත්කරන සමාජයක් බවට පත්වී ඇත. එවැනි සමාජයක අපගේ දරුවන් යහපත් එමෙන්ම දේව භය ඇති දරුවන් ලෙස වර්ධනය වන්නේ කෙස්ද යන භය නිරතුරුවම අප තුළ පවතී. අපගේ දරුවන් මෙවැනි සමාජයක දෙවියන්වහන්සේ බලාපොරොත්තුවන ආකාරයට ජීවත් වෙමින් විනිශ්චයේදී වරදකරුවන් බවට පත් නොවන ආකාරයෙන් වර්ධනය වන්නේ කෙසේද?

මෙවැනි ප්‍රශ්නවලට පිළිතුර දේව වචනයේ එපීස 6:4 පාවුල් තුමා විසින් සඳහන් කර ඇත. **"පියවරුනි,නුඹලාගේ දරුවන්ට කෝප නූපදවා ස්වාමීන්වහන්සේගේ හික්මවීමෙන්ද අවවාදයෙන්ද ඔවුන් ඇතිකරපල්ලා".** අප මේ ආකාරයට ක්‍රියා කරනවිට දෙවියන්වහන්සේම අපගේ දරුවන් සම්බන්ධයෙන් ක්‍රියා කරනසේක. දේව වචනයට අනුව දරුවන්ව රැකබලා ගැනීම, ඔවුන්ව පුහුණු කිරීම සහ විනයානුකූලව ගොඩනැගීම දෙවියන්වහන්සේ දෙමව්පියන්ට දී ඇති වගකීමකි. අපගේ දරුවන් දෙවියන්වහන්සේගේ ස්ත්‍රීන් සහ පුරුෂයන් ලෙස ගොඩනැගීමේ කාර්යය අපගේ ප්‍රඥාවෙන් සහ ශක්තියෙන් කළ නොහැක. විනාශය කරා ගමන් කරන්නාවූ මේ ලෝකයේ කිතුණුවන් ලෙස ස්ථිරව ජීවත්විය හැක්කේ දෙවියන්වහන්සේ සමඟ සෑම පුද්ගලයෙකුටම ඇත්තාවූ පෞද්ගලික සම්බන්ධතාවය සහ උන්වහන්සේ කවුද යන්න පිළිබඳව ඇත්තාවූ දැනගැන්මයි. මෙය පුද්ගලයෙකුට ලබාදිය හැක්කේ ශුද්ධාත්මයාණන්වහන්සේට පමණී. අපට දෙමව්පියන් ලෙස දරුවන්ට දෙවියන්වහන්සේට ළඟා කිරීමට කළහැකි දේවල් කිහිපයක් පහත දක්වා ඇත.

**1. දරුවන් පිළිබඳව නොකඩවා යාච්ඤා කිරීම**

ඔබේ දරුවන් දෙවියන්වහන්සේට අයිති බවත් ඔවුන් දෙවියන්වහන්සේව ගෞරවයට පත් කිරීම සඳහා වර්ධනය වියයුතු බවත් සිහි කරමින් යාච්ඤාවෙන් ඔවුන් වෙනුවෙන් මැදහත්කාරකම් කරන්න. අලස "නුඹලා නොවී, ඇදහිල්ලද ඉවසිලිවන්තකමද කරණකොටගෙන පොරොන්දු උරුමකරගෙන සිටින්නන්ගේ අඩිපාරේ යන්නන් වෙන පිණිසය" (හෙබ්‍රෙව් 6:12).

**2. දෙවියන්වහන්සේගේ වැඩසිටීම ඔබ ගේ නිවසේ සත්‍ය බව දැනෙන ආකාර යට ජීත්වන්න.**

**3. ඔබේ දරුවා තුළ ආත්මික දේ සම්බන්ධව තද ආශාවක් ඇතිකරන්න.**

**4. ඔබේ දිනපතා ජීවිතයේ සෑම කාරණයකදී සහ සෑම කටයුත්තකදීම දෙවියන්වහන්සේට ප්‍රමුඛතාවය දෙන්න.**

**5. දෙවියන්වහන්සේ සමඟ වැඩි කාලයක් ගතකිරීමට ඔබේ දරුවාව ධෛර්යමත් කරන්න.**

දෙවියන්වහන්සේ දැනගැනීමේ අත්ති වාරම ළමයින් තුළ ඇති කළයුතුවන්නේ ඔවුන් කුඩා කලසිටමය. සත්‍යවශයෙන්ම දෙවියන්වහන්සේට පසුව වුවද එය කළහැක. නුමුත් දෙවියන්වහන්සේගේ සැලැස්ම ඔවුන් කුඩාකල සිට උන්වහන්සේව දැනගැනීමයි.

අපි අපෙන්ම ප්‍රශ්න කිහිපයක් අසාගනිමු. දෙවියන්වහන්සේ අපේ නිවසේ සිටින බව අපගේ දරුවන් දන්නවාද? අපට දේවභය තිබෙනබවත්, අපි දෙවියන්වහන්සේට ප්‍රේම කරනබවත්, උන්වහන්සේව විශ්වාස කරමින් කීකරු වන බව ඔවුන් දකිනවාද? අපි ඇත්තටම දේව භය අතිව සිටින බව, යොවුන්වියේ දරුවන්ගේ වයස සෑම දරුවෙකුටම ව්‍යාකූලබව ඇතිකරන්නාවූ වයස් මට්ටමකි. ඔවුන්ට සම වයස් කාණ්ඩයේ අයගෙන් විශාල බලපෑමක් ඇත. එමෙන්ම ඔවුන්ගේ ශාරීරික වෙනස්වීම් බොහොමයක් සිදුන්නාවූ වයස් කාණ්ඩයකි. ඔවුන්ට සම්බන්ධවන්නාවූ අනෙක් පුද්ගලයන්ගේ ජීවිත යොවුන්වියේ දරුවන්ට විශාල බලපෑමක් ඇතිකරයි.

නමුත් ඔවුන් දෙවියන්වහන්සේව ඇත්තටම අත්දැක තිබේ නම් සහ ඔබගේ ජීවිතය තුල ඒ දේ දකී නම් ඔවුන්ට බොහෝදුරට ඒවා අමතක නොවෙනු ඇත. ඔබගේ නිවසේ දේවභය තිබේ නම් ඔබේ දරුවන් සහ දෙවියන්වහන්සේ අතර සම්බන්ධතාවය ගොඩනැගීම ශුද්ධා ත්මයාණන්වහන්සේට කළහැක. ළමයෙකුගේ ජීවිතයේ දෙවියන්වහන්සේගේ චරිත ගුණාංග, දෙවියන්වහන්සේ පිළිබඳව දැනගැන්ම සහ දේවභය ගොඩනැගෙනුයේ නිවස තුළය. එවිට ඔබේ යොවුන්වියේ දරුවා දෙවියන්වහන්සේව නොදන්නාවූ ලෝකය ඉදිරියේ තිබෙන ගැඹුරු අන්ධකාරය ඉදිරිපිට දෙවියන්වහන්සේව දන්නාවූ හරි ස්ථානය ගතහැකි පුරුෂයෙක් සහ ස්ත්‍රියෙක් වනු ඇත.

දෙවියන්වහන්සේගේ කැමැත්ත නම් කිසිම දරුවෙකු විනාශ වීම නොව ඔවුන් දෙවියන්වහන්සේගේ මහත් සඵලත්වය අත්දැකීමයි. ඔබේ යොවුන් වියේ දරුවා ක්‍රිස්තුස්වහන්සේ සමඟ ඇතිවන්නාවූ සම්බන්ධතාවයේ යතුර වනුයේ ඔවුන්ගේ නිවස සහ දමව්පියන්ගේ ජීවිතයි. **"දරුවෙකු සුදුසු මාර්ගයේ පුහුණු කරපන්න. එවිට ඔහු වයස්ගත වූවිටත් එයින් අහක්ව නොයනු ඇත".**

**අනෝමා රෙකමන්**

## 19 වන පිටුවෙන් - බාර්ණබස්..

වතාවරණයන් වලදී ඉවසීමෙන් හා වගකීම් සහිතව දෙවියන්වහන්සේගේ ගෞරවයට හානි නොවන ආකාරයෙන් ක්‍රියා කිරීම වැදගත්ය.

● බාර්ණබස් දෙවියන්වහන්සේගේ ජනතාවට උන්වහන්සේගේ වචනය ඉගැන්වූවේය( ක්‍රියා 15:35). දේවවචනය එය නොදන්නාවූ අයට අපට හැකි ආකාරයෙන් නිවැරදි ලෙස ඉගැන්විය යුතුය(1 තිමෝති 4: 13-16/මතෙව් 28:20).

● බාර්ණබස් තමන් පෙර සේවය කල ජනතාව නැවත බලන්නට සිතේ බරක් තිබීම එනම් ඔහුට එඬේර හදවත තිබිණි. (ක්‍රියා 15:36)- කිතුණු නායකන් හමට තිබිය යුතු හදවත එඬේර හදවතයි. යේසුස්වහන්සේ තුළ තිබුණා වූ හදවත සෑම නායකයකු තුලම තිබිය යුතුය(1 පේතෘස් 5:2-3).


● බාර්ණබස් සත්‍ය වෙනුවෙන් පෙනී සිටීම ( ක්‍රියා 15:37-39).- අපද සත්‍ය දන්නා වූ අය හැටියට සත්‍යවාදීව ජීවිත් විය යුතුවා මෙන්ම කොතරම් පාඩු නින්දා තිබුණත් සත්‍ය වෙනුවෙන් පෙනී සිටිය යුතුය.

### බාර්ණබස්ගේ ජීවිතයේ තිබූ තවත් යමක්

- ක්‍රියා 11 : 30 - විශ්වාසවන්ත ගණකාධිවරයා
- ක්‍රියා 12 : 25 - වගකීම් සහිත සේවකයා
- ක්‍රියා 13 : 2 - ස්වාමින්වහන්සේ වෙන් කරගත් දාසයා
- ක්‍රියා 13 : 7 - යේසුස්වහන්සේගේ තනාපතියා
- ක්‍රියා 13 : 43 - ධෛර්‍යමත්කරන්නා
- ක්‍රියා 13 : 46 - නිර්භීත සේවකයා
- ක්‍රියා 13 : 50 - දුක් දරන්නා
- ක්‍රියා 15 : 2 - ප්‍රඥාවන්තයා
- ක්‍රියා 15 : 12 - දෙවියන්වහන්සේගේ අතෙහි සැරටිය
- ක්‍රියා 15 : 22 - විශ්වාසවන්තයා

**ගුරුහරු**

# ක්‍රිස්තුස්වහන්සේගේ සොයා දැන ගත නොහැකි සම්පත



**"සියළු ශුද්ධවන්තයන්ගෙන් ඉතා කුඩා තැනැත්තාවූ වූ මට මේ අනුග්‍රහය දෙන ලද්දේ ක්‍රිස්තුස්වහන්සේගේ සොයා දැනගත නොහැකි සම්පත ගැන අන්‍යය ජාතීන්ට දේශණා කරන්නට" යයි** (එපීස 3:8) පාවුල් තුමා පවසයි. පාවුල් තුමා නගරයෙන් නගරයට ගොස් අන්‍ය ජාතික සහ අන්‍ය ආගමික මිනිසුන්ට දේශණා කලේ ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන පව්කමාව ලැබීම ගැන පමණක් නොවේ. පව්කමාව ලබා ගැලවීම අත්දකින අයට උරුම වී ඇති ක්‍රිස්තුස්වහන්සේගේ සොයා දැනගත නොහැකි සම්පත ගැනද මොහු කතා කර තිබේ. මේ සම්පත කුමක්දැයි අපි දැන් සොයා බලමු.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇදහිලිවන්ත යෙකු හැටියට ස්වර්ගීක වූ ආත්මික වින්දනයක් ලැබීම අපට උරුම වූ දෙයකි. ප්‍රේමය, ප්‍රීතිය සහ සමාදානය වැනි දෑ මහ ඉහලින්ම භුක්ති විදීමට ඇදහිලිවන්තයෙකුට උරුමය. පහත සඳහන් සම්පත් ලැයිස්තුව සලකා බලන්න.

**1. කිසි නුවණකින් දැන ගත නොහැකි වූ දෙවියන්වහන්සේගේ සමාදානය - පිලිප්පි**

**2. ක්‍රිස්තුස්වහන්සේගේ දැනගත නොහැකි ප්‍රේමය - එපීස 3:18**

**3. කියා නිමකල නොහැකි වූ තේජසින් පූර්ණවූ මහත් ප්‍රීතිය - 1පේතෘස් 1:9**

**4. තේජසේ බලාපොරොත්තුව - කොලොස්සි 1:27**

**5. රනට වඩා අගේව තිබෙන ඇදහිල්ල - 1පේතෘස් 1:7**

**6. දෙවියන්වහන්සේගේ දරුවන්ගේ මහිමාන්විත නිදහස්කම - රෝම 8:21**

**7. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නැවත නැගිටීමේ බලය - එපීස 1:19-20**

ඉහත සඳහන් සම්පත් උපරීමයෙන් භුක්ති විදීම ඇදහිලිවන්ත අපගේ උරුමයයි. ඒවා යේසුස්වහන්සේ විසින් ශුද්ධාත්මයානන්වහන්සේ කරණකොටගෙන අපට දායාද කර තිබෙන දේය. පසුගිය කලාපය තුළින් අප සලකා බැලුවේ මෙම ලැයිස්තුවේ පළමුවන සම්පත් වන කිසි නුවණකින් දැනගත නොහැකි වූ දෙවියන්වහන්සේගේ සමාදානයයි. මේවර එහි එන දෙවන සම්පත ගැන සිතා බලමු.

## ක්‍රිස්තුස්වහන්සේගේ දැනගත නොහැකි ප්‍රේමය - එපීස 3:18

යේසුස් ක්‍රිස්තස්වහන්සේ අපට ප්‍රේම කොට

අප ගැලවීම උදෙසා තමන් ජීවිතය පූජා කළ බව අපි දනිමුව. එහෙත් එම ප්‍රේමය ගැඹුරු ලෙස අප විසින් අත්දකිනවාද, භුක්තිවිඳිනවාද යන පැණය අපගෙන්ම අසා ගත යුතු වෙමු. මෙය අප විසින් උරුම කරගෙන භක්තිවිඳිය යුතු සම්පතක් හැටියටයි ශුද්ධ ලියවිල්ලෙහි සඳහන් කර ඇති ක්‍රිස්තුස්වහන්සේගේ ''ප්‍රේමයෙහි පලල, දිග, උස සහ ගැඹුර'' අප ගවේෂණය කළ යුතුය (එපීස 3:19). ක්‍රිස්තුස්වහන්සේගේ මෙම අපූරු ප්‍රේමයේ පැතිකඩ කිහිපයක් සලකා බලමු.

## සදාකාලික ප්‍රේමය

දෙවියන්වහන්සේ අපට ප්‍රේමකර ඇත්තේ සදාකාල ප්‍රේමයකින් බව යෙරෙමියා 31:3 න් අපි තේරුම් ගනිමු. ''සදාකාල ප්‍රේමයතින් නුඹට ප්‍රේමකලෙමි, එබැවින් දයාබර කමින් නුඹ ඇදගතිමි''. සදාකාලික යන වචනය දෙවියන්වහන්සේට අදාල කර සඳහන් කරන විට ඉන් අදහස් වන්නේ ''අවසානයක් නැත'' යනුවෙන් පමණක් නොව ආරම්භයකුත් නැත යන්නයි. ඒ නිසා දෙවියන්වහන්සේ අප කෙරෙහි දක්වා ඇති ප්‍රේමය සදාකාල අතීතය දක්වා දිව යයි. එය අපට තේරුම් ගැනීමට තියා සිතාගන්නට වත් බැරි සත්‍යතාවයකි. අප උපදින්නටත් ප්‍රථමයෙන් දෙවියන්වහන්සේ අපට ප්‍රේම කලේ කෙසේද? එය ඇත්තෙන්ම අභිරහසකි, එහෙත් සත්‍යයකි. ''උන්වහන්සේ ඉදිරිපිට ප්‍රේමයෙන් ශුද්ධව නොකැලැල්ලව සිටින පිණිස ලෝකය මැවීමට ප්‍රථමයෙන් ක්‍රිස්තුස්වහන්සේ තුළ අප තෝරාගත් ලෙසම'' (එපීස 1:3,4). මෙයින් අදහස් වන්නේ කෙතරම් අපූරු සැලසුමක්ද? අපව දෙවියන්වහන්සේ තෝරාගත්තේ ක්‍රිස්තුස්වහන්සේ තුළය. උන්වහන්සේ ''ලෝකයේ පටන් ගැන්මේ සිට මරණ ලද බැටළු පැටවාණන් ලෙස '' එළිදරව් 13:8 නම් කර තිබේ. සදාකාල අතීතයේ සිට පරණගිවිසුම් යුගය හරහා යේසුස්වහන්සේගේ කුරුසිපත් වීමේ දිනය දක්වා දෙවියන්වහන්සේ තම පුත්‍ර වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මරණය පිළිබඳව සිතමින් සිටි සේක. එය කෙතරම් වේදනාකාරී අත්දැකීමක් වන්නට ඇත්ද? දෙවියන්වහන්සේ එවන් වේදනාකාරී අත්දැකීමක් තුළින් ගියේ ඔබට සහ මට තිබූ ප්‍රේමය නිසාය. මෙයට සදාකාලික ප්‍රේමයයි කියනු ලැබේ. පරණ ගිවිසුම් යුගය පුරා සතෙකු පූජා කරන සෑම අවස්ථාවකදීම දෙවියන්වහන්සේ ඒ තුළින් දුටුවේ තම පුත්‍රයාණන්ගේ මරණයයි. ඒ නිසා දෙවියන්වහන්සේගේ සිත තුළ උන්වහන්සේගේ පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සිය දහස් වතාවක් මරණයට පත් වුනාක්මෙන්ය. අලුත් ගිවිසුම් සභාවේ ප්‍රේරිත පේතෘස් තුමා විසින් කළ පළමු දේශනාවේදී යේසුස්වහන්සේගේ මරණය පිළිබඳව සඳහන් කරන අයුරු බලන්න. ''යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ නියමවූ මන්ත්‍රණය සහ පෙර දැනගැන්ම ලෙස භාර දෙන ලදුව නුඹලා ව්‍යවස්ථාව නොසලකන අය ලවා කුරුසියෙහි ඇණ ගස්වා මැරවූවහුය'' (ක්‍රියා 2:23). දෙවියන්වහන්සේගේ සදාකාලිය ප්‍රේමය නිසා තම පුත්‍රයාණන්ගේ මරණයේ දුක සදාකාල අතීතයේ සිට තම හදවතේ දරා සිටින්නට දෙවියන්වහන්සේ කැමති වූ සේක.

## පරිත්‍යාගශීලී ප්‍රේමය

ක්‍රිස්තුස් යේසුස්වහන්සේගේ ප්‍රේමය ගැඹුරු ලෙස මෙනෙහි කිරීමේදී එය පරක් තෙරක්

නෙමැති සදාකාලික ප්‍රේමයක් පමණක් නොව මහා පරිත්‍යාගශීලී ප්‍රේමයක් බවද අපට වැටහී යයි. අතිශුද්ධ වු දේව පුත්‍රයාණන් මෙවැනි පව්කාර ලෝකයකට පැමිණීමට කැමති වීමම කෙතරම් පරිත්‍යාගයක්ද? දෙවියන්වහන්සේගේ ශුද්ධත්වය සමග සන්සන්දනය කර බලන විට අපි සිටින මේ ලෝකය පාපකාරී නාරා වලකී. අශූචි පිරුණු කුණු වලක වසර 33ක් තියා එක මොහොතක් වත් ගත කිරීමට අපි නම් කැමති නොවෙමු. එහෙත් යේසුස්වහන්සේ කළේ හරියටම එවැනි දෙයක්ය. ''මෙන්න මම මෙහිය, මා යැව්ව මැනවැ'' යි (යෙසායා 6:8) පැවසු එතුමාණෝ ''දෙවියන්වහන්සේට සමාන ව සිටීම තමන් විසින් අල්ලාගෙ නම සිටිය යුතු වු වස්තුවකැයි නොසිතා එය ඉවත් කර දාසයකුගේ ස්වරූපය ගෙන මනුෂ්‍යයන්ගේ සමානත්වයට පැමිණී සේක'' (පිලිප්පි 2:6,7). මෙලොවෙයි සිටි කල උන්වහන්සේ බැලු බැලු අත දුටුවේ පාපයයි. සියලු මිනිසුන්ගේ සිත්වල ඇති පාප කාරී ස්වභාවය උන්වහන්සේට පෙනුණි. එපමණකුත් නොව පව්කාර මිනිසුන්ගේ උසුළු විසුළු, ගැරැවුම් නින්දා අපහාස සහ මරණීය පීඩා විඳීමට උන්වහන්සේ කැමති වු සේක. මෙය කෙතරම් පරිත්‍යාගයක්ද? ''අප පව්කාරයන්ව සිටියදීම අප වෙනුවට ක්‍රිස්තුස්වහන්සේ මරණය වින්දේ'' සැනෙකින් දේවදූතයන් ලෙගියොන් දොළොසකට වඩා තමන් ළඟට කැඳවා ගන්න බලය සහ හැකියාව තිබියදීය. විශ්වය මවා එය තමන්ගේ බලපරාක්‍රමයේ වචනයෙන් දරා සිටින්නාවූ යේසුස්වහන්සේ (හෙබ්‍රෙව් 1:1-3) මේ පොළාවේහි හිස තබා නිදියන්නට තැනක් නොමැති මිනිසෙකු වීමට කැමති වු සේක. එසේ වීමට උන්වහන්සේට කිසිවෙකු බල කලේ නැත. උන්වහන්සේ ඒ දේ සියල්ල කලේ හුදෙක් තම පරිත්‍යාගශීලී ප්‍රේමය නිසාමය.

## ගැඹුර මිණිය නොහැකි ප්‍රේමය

ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමයේ පළල,දිග, උස සහ ගැඹුර කිමෙක්ද කියා තේරුම් ගන්නට ඇදහිලිවතුන්ට පුළුවන් වීම පිණිස පාවුල් තුමා යාච්ඤා කලේය. යේසුස්වහන්සේ අපට දැක්වූ ප්‍රේමයේ ගැඹුර ගෙත්සමන උයනේදි සහ කුරුසිය මතදී අප හට ප්‍රදර්ශණය කැරේ. "මැරෙන තරම් මාගේ ආත්මය ඉතා ශෝක සහිත'' යයි ගෙත්සමන උයනේදී යේසුස්වහන්සේ තම ගෝලයන්ට ප්‍රකාශ කලේ ඇයි? යේසුස්වහන්සේ අතිශයෝක්ති භාවිතා නොකළ නිසා උන්වහන්සේ පැවසුයේ උන්වහන්සේට ඇත්තෙන්ම දැණුනු දෙයයි. එසේ ''මැරෙන තරමට'' ආත්මයට ශෝකය දැණුනේ ඇයි? ඒ මරණ භය නිසා ඇති වු දුක හේතුවෙන්ද? කොහෙත්ම නැත. තමන්වහන්සේ මරණයට පත් වන බව කිහිපවිටක් යලි යලි තම ගෝලයන්ට උන්වහන්සේ විසින් ප්‍රකාශකර තිබුණි. එසේ නම් මැරෙන තරම් මේ මහා ශෝකයට හේතු වුයේ කුමක්ද? ඇත්තෙන්ම එය ''මැරෙන තරම්'' වු ශෝකයක්ද? ඔව් එසේ විය යුතුය. අපගේ ඇසට නොපෙනෙන මහා භයංකර දෙයක් සිදු වෙමින් පැවතුණි. අප සැම දෙනාගේ පාප උන්වහන්සේ පිටට පතිත වෙමින් තිබුණි. සියලු කාලවල ජීවත් වු සියලු මිනිසුන්ගේ පාප කන්දරාව මෙතැකැයි ගණන් කරන්නට කාට පුළුවන්ද? ඒ සියල්ලේ බර උන්වහන්සේගේ හදවතට දැණුනි. උන්වහන්සේ ඉඩ දුන් සේක් නම් ගෙත්සමන උයනේදීම උන්වහන්සේගේ මරණය සිදුවීමටත් ඉඩ තිබිණි. යේසුස්ස්වහන්සේ අප උදෙසා ''පාපය'' බවට පත්වූ බව බව

2කොරින්ති 5:21 හි සඳහන් කර තිබේ. කුරුසිය මතදී යේසුස්වහන්සේට සිදුවුයේ එම දේමය. අප සියල්ලන්ගේ පාප වලින් වැසීගිය යේසුස්වහන්සේ එකම පාප ගුලියක් මෙන් දෙවිපියාණන්වහන්සේට පෙනෙන්නට ඇත. එතැනදී සිදුවූ දේ මනුෂ්‍ය ඉතිහාසය දෙකඩ කළ අද්භූත, අරුම පුදුම සිදුවීමයි. කුරුසියක එල්ලී සිටින පාපයෙන් වැසී සිටි තම පුත්‍රවූ යේසුස්වහන්සේ වෙතින් පියාණන්වහන්සේ තම නෙත් ඉවතට හරවා ගත් සේක. මෙවැනි දෙයක් කිසිදිනක සිදුවී තිබුනේවත් යළි කිසිදු දිනෙක සිදුවන්නේවත් නොමැත. ''මාගේ දෙවියන්වහනන්ස, මාගේ දෙවියන්වහන්ස ඔබ මා අත් හැරියේ මක්නිසාද'' යැයි (මතෙව් 26:46) යේසුස්වහන්සේ පැවසුයේ මේ අවස්ථාවේදීය. මෙහිදීත් යේසුස්වහන්සේ අතිශයෝක්තියක් භාවිතා කළා නොව සිදුවූ සත්‍යය ඒ හැටියෙන්ම ප්‍රකාශ කල සේක. දෙවිපියාණන්වහන්සේ විසින් තම පුත්‍රයාණන්ව එක් මොහොතකට අත්හැරිය සේක. මෙය අපට හිතන්නටවත් බැරි පුදුම දේයකි. එකම දෙවියන්වහන්සේ ශුද්ධ වූ ත්‍රිත්වයක් ලෙස වැඩ සිටින අතර එම ත්‍රිත්වය තුළ ඇති එකත්වයත් සම්බන්ධතාවයත් කිසි දිනෙක බිඳවැටීමට නොහැකිය. එහෙත් අපගේ පාපවලට වන්දි ගෙවන මොහොතේ ඒ දේ සිදු වූ බව යේසුස්වහන්සේගේ වචන වලින් පැහැදිලි වේ. මේ තමයි යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ගැඹුර මිණිය නොහැකි වූ ප්‍රේමයේ තරම.

## නොම්යෙන ප්‍රේමය

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය අමරණීය වූ එකකි. යේසුස්වහන්සේ ''ලෝකයෙහි සිටියාවූ ස්වකීය සෙනගට ප්‍රේමයෙන් සිට අන්තිම දක්වා ඔවුන්ට ප්‍රේමකළ සේක'' (යොහාන් 13:1). නොම්යෙන ප්‍රේමය පරණගිවිසුම් ලියැවිල්ලෙහි සඳහන්ව ඇත්තේ කරුණාගුණය ලෙසයි. එය හෙබ්‍රෙව් බසින් සුවිශේෂී වූ වචනයකි. ඉශ්‍රායෙල් ජාතිය දෙවියන්වහන්සේ හා සමග ඇති සම්බන්ධතාවයට පදනම වනුයේ මේ කරුණා ගුණයයි. ''ඔබගේ කරුණා ගුණය ජීවිතයට වඩා යහපත''(ගීතාවලිය 63:3) කරුණා ගුණය, දයා කරුණාව නොම්යෙන ප්‍රේමය, දයාබර කම සහ ගිවිසුම් ප්‍රේමය ලෙස පරිවර්ථනය කරනු ලබන්නේ එකම හෙබ්‍රෙව් වචනයකි. දෙවියන්වහන්සේගේ ප්‍රේමය ඔබගේ ප්‍රතිචාරයට අනුව අඩු වැඩි වන්නක් නොවේ. අද ඔබ උන්වහන්සේව ප්‍රතික්ෂේප කරතත් උන්වහන්සේගේ අමරණීය පෙම වෙනස් වන්නේ නැත. ඔබේ සිත ලෝකය වෙත ඇදී ගොස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ඇති ප්‍රේමයෙන් ඔබ හීන වන්නේ නමුදු උන්වහන්සේ ඔබ කෙරෙහි දක්වන ප්‍රේමය එකාකාරවම තිබේ. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සොයා දැන ගත නොහැකි සම්පත් ගවේෂණයෙහි යෙදෙන ඇදහිලිවන්තයා උන්වහන්සේගේ සොයා දැනගත නොහැකි ප්‍රේමය හඳුනාගෙන භුක්තිවිදිය යුතුය. එසේ භුක්තිවිදින යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය අන් අයට පිළිග ැන්වීමට එමගින් හැකියාව ලැබේ. පරිත්‍යාග ශීලී ප්‍රේමය සහ ක්‍රිස්තුස්වහන්සේගේ ගැඹුර මිණිය නොහැකි ප්‍රේමය හඳුනාගෙන භුක්තිවිදින ඇදහිලිවන්තයා එවැනි ප්‍රේමයකින් අන්අයට ප්‍රේම කිරීමට ඉගෙන ගනී.

**නෙවිල් ජයසුන්දර**

# ආත්මික යුද්ධය



ඇදහිලිවන්තයන් ලෙස අපි ආත්මික යුද්ධයක නිරතව සිටිමු. අපගේ ජීවිතයේ සිදුවන සෑම දුෂ්කර කරදරකාරී සිදුවීමක්ම මෙම ආත්මික යුද්ධයෙහි අභියෝගයක් ලෙස සැළකිය හැක. ඇදහිලිවන්ත ජීවිතයේ මෙම ආත්මික යුද්ධය යථාර්ථයක් බව ඔබ සහතික කොට දැනගත යුතුයි. ශුද්ධ බයිබලයේ අළුත් ගිවිසුමෙහි ක්‍රිස්තියානි කරුවා යුද්ධ භටයෙකුට සමාන කර තිබෙන බවත් ක්‍රිස්තියානි ජීවිතය යුද්ධයක් බවත් සනාථ කරන ශුද්ධ ලියවිලි කොටස් කියවන්නට පුළුවන, අපව කැඳවා තිබෙන්නේ අපගේ ඇසට නොපෙනෙන ඉතාමත් දුෂ්ටකාරවූ නපුරු බල කණ්ඩායමක් සමඟ පොරබැදීමට වන අතර මෙම යුද්ධය සැබෑමවූ එකක්ය. ''තිමෝතියස්නි, නුඹ ගැන කලින් කීවාවූ අනාගතවාක්‍ය ලෙස මේ ආඥාව නුඹට භාරදෙමි. එනම් නුඹ ඇදහිල්ල සහ යහපත් හෘදසාක්ෂියක් ඇතුව සිට ඒ වාක්‍යවලින් යහපත් යුද්ධය කරන ලෙසය'' (1 තිමෝති 1:18,19).

**"ඇදහිල්ලේ යහපත් සටනෙත් සටන්කොට සදාකාල ජීවනය අල්ලා ගනින්න." (1 තිමෝති 6:12),**

**"මම යහපත් යුද්ධයෙහි යුද්ධකළෙමි, මම දිවීම කෙළවරකළෙමි, මම ඇදහිල්ල රක්ෂා කළෙමි"( 2 තිමෝති 4:7),**

**"ක්‍රිස්තුස්වහන්සේගේ යහපත් භේවායෙකුමෙන් දුක් විඳීමට පංගුකාරයෙක් වෙයන්න" (2 තිමෝති 2 : 3),**

**"භේවාකම් කරන්නාවු කිසිවෙක්, ඔහු භේවායෙකුමෙන් ලියාගත් අය සතුටු කරන පිණිස, මේ ජීවිතයේ කාරණාවලට පටලැවෙන්නේ නැත".( 2 තිමෝති 2 : 4)**

**"මක්නිසාද, අපගේ පොරබැදීම වනාහි මාංසයට හා රුධිරයට විරුද්ධව නොව, අධිපතිකම් වලටත් පරාක්‍රමධාරීන්ටත් මේ අන්ධකාරයේ ලෝක මුළාදෑනීන්ටත් ස්වර්ගී ය ස්ථානවල සිටින දුෂ්ට කමේ ආත්ම සේනාවන්ටත් විරුද්ධවය" ( එපීස 6:12),**

**"අවදිව සිටපල්ලා, ඇදහිල්ලෙහි ස්ථිරව සිටපල්ලා, පුරුෂයන්මෙන් සිටපල්ලා, ශක්තිමත් වෙයල්ලා" ( 1 කොරින්ති 16:13).**

ඉහත සඳහන් සෑම බයිබල් පාඨයකින්ම සනාථකරන්නේ එකම, පණිවුඩයකි. සැබෑ ක්‍රිස්තියානිකම යනු සටනක්, පොරබැදීමක් හා යුද්ධයකි.

කොලොස්සි 1:3 හි පාවුල් තුමා සඳහන් කර තිබෙන ආකාරයට අන්ධකාරයේ ලෝක මුළාදෑනියා වන සාතන් කිසිසේත්ම සතුටුවන්නේ නැහැ. දෙවියන්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ කරනකොටගෙන සතුරාට එරෙහිව අප උදෙසා සම්පූර්ණ කල ජයග්‍රාහි ක්‍රියාව පිළිගැනීමට. ඔහුගේ ප්‍රධාන අරමුණ වන්නේ දෙවියන්වහන්සේගේ යහපත්කම, ප්‍රේමය, පවිකමාව, ආරක්ෂාව, සැපයීම සහ පොරොන්දු ගැන ඇදහිලිවතුන්

වන්නේ දෙවියන්වහන්සේගේ යහපත්කම, ප්‍රේමය, පවිකමාව, ආරක්ෂාව, සැපයීම සහ පොරොන්දු ගැන ඇදහිලිවතුන් තුල සැක ඉපදවීමට සැලැස්වීමෙන් අපගේ ඇදහිල්ල විනාශ කිරීමයි. තවත් ආකාරයකට කියනවානම්, සාතාන් අපගේ ජීවිතවලට දුෂ්කර අත්දැකීම් ඇතිකරවන්නේ හුදෙක් අපව වේදනාවට පැමිණවීමට පමණක් නොව, එමගින් දෙවියන්වහන්සේ කෙරෙහි තිබෙන අපගේ විශ්වාසය විනාශ කිරීමටයි.

පාවුල් තුමා එපීස 6:10හි මෙසේ අපට අනුශාසනා කරනවා. **"ස්වාමීන්වහන්සේ තුළද උන්වහන්සේගේ ශක්තියේ බලවත්කමෙහිද බලවත්වෙන්න"** එවිට අපට පුළුවන්වෙනවා මෙම යුද්ධයට ඇතුල්වී අපගේ විරුද්ධකාරයා වන සතුරා සමඟ සටන් කරන්න.

දෙවියන්වහන්සෙට නිරතුරුවම විරුද්ධව සිටීමට මේ ලෝකයෙහි තාවකාලික නිදහසක් සතුරාට දෙනුලැබ තිබෙන නමුත් (1 යොහන් 5:19), ඔහුගේ එම උත්සහය සහමුලින්ම විනාශ කර දැමීමට ක්‍රිස්තුස්වහන්සේ මේ ලොවට පැමිණි සේක (1 යොහන් 3:8). මේ ජීවිත කාලය තුලදි සෑම පරීක්ෂාවක්ම ජයගැනීම සඳහා දෙවියන්වහන්සේ අපට බලය හා පොරොන්දු ලබා දෙන සේක (1 කොරින්ති 10:13). මෙම යුද්ධය සභා නායකයන්, වචනය දේශනාකරන අය හෝ දේව සේවකයින් උදෙසා පමණක් නොවෙයි. මෙම යුද්ධය ඇදහිලිවතුන්වන අපි සියළු දෙනාටයි. එහෙත් දෙවියන්වහන්සේ දැනටමත් අපට ජයග්‍රහණය ලබා දී ඇත. මේ පිළිබඳව පහත සඳහන් බයිබල් පද කියවා , විශ්වාස කරන්න.

**"තවද ක්‍රිස්තුස්වහන්සේ තුළ නිතරම අප ජයට පමුණුවන්නවූ, සියලු තැන්වල අප ලවා උන්වහන්සේම දැනැන්ම නැමැති සුවඳ පතුරවන්නාවූ දෙවියන්වහන්සේට ස්තුතිවේවා" (1 කොරින්ති 2 :14).**

**"මක්නිසාද අපගේ යුද්ධායුධ මාංසික නොවේය. එහෙත් ඒවා බලකොටු බිඳහෙළීමට දෙවියන්වහන්සේ ඉදිරිපිට බලසම්පන්නය" (2 කොරින්ති 10: 4),**

**' නුමුත් අපට ප්‍රේමකලාව තැනැන්වහක්සේ කරණකොටගෙන අපි මේ සියල්ලේදි අතිශයින්ම ජයගන්නෝ වෙමුව" (රෝම 8 : 37).**

**ඈන් ජයසුන්දර.**

# සිංහාසනයේ වැඩසිටින දෙවියන්වහන්සේ ගැන දර්ශණය



අහස් කුසේ එක් දොරක්
විවර වී තිබෙන බව දුටිමී
හොරණෑවක ශබ්දය මෙන්
මා හා කථා කරනු ඇසිමී.
නැගී වරෙන් මෙහි සිදුවන දේවල්
පෙන්වමී කී සදෙහි
ආත්මයාණන් තුළ මා සිටිනා
බව මා හට දැනුනී.

සූරියකාන්ත මැණිකක් ලෙසිනේ
ලෝහිතංග මැණිකක් ලෙසිනේ
බැබලුනි එතුමාණන් සිහසුන වටේට
මරකත වැනි දේදුන්නක් නැග තිබුණී
ඒ වට සිහසුන් විසිහතරක් මත
සුදුවත් ඇඳතෙන ඔටුණු පැළඳගෙන
විසිහතරක් සිටිනා බවකුත් මම දුටිමී.

සිංහාසනයෙන් විදුලි ගර්ජනා
නික්මෙන ශබ්දයකුත් ඇසිමී
සිහසුන අබියස ගිනි පහන් හතක්
දැල්වෙන බව දුටිමී
එවා සමිඳුගේ ආත්මයාණන් සත්දෙනා
බවට මට දැනුනි
සිහසුන ඉදිරියෙ වීදුරු සමුදුරක්
වැනි වූ පෙනීමක් ඇත් වූයේ
සිහසුන මැද හා ඉදිරියේ
අවටත් ඇසින් පිරුණු
සිව්දෙනෙක් සිටිනා බව දුටිමි.
පළවෙනියා සංහයකුට සමානය
දෙවනියා වසසෙකුට සමානය
තුන්වැනියා මිනිසකුට සමානය
රජාලියකුට සිව්වෙනියා සමානය

එක්කෙනකුට සය බැගින් පියාපත් තිබුණි.
ඔවුන් ඇතුළතත් අවටත් ඇස් පුරාම තිබුණි.
ඔවුහු දෙවි සමිඳුට රෑ දාවල්
ශුද්ධය, ශුද්ධය, ශුද්ධය යයි කියති
ඔවුන් එසේ ගෞරව කරන අතරේ
වැඩිමහල් වූ හතර දෙනා
දෙවි සමිඳුන් පැසසුම් හා ගෞරව ලබන්ට
වටිනා උතුමාණන් බව කියමින්
දෙවිඳුගෙ සිහසුන අභියස
වැඳ වැටෙන බව දුටිමි
සමිඳුනි ඔබ මේ සියලුදේම
මවනා ලද බව කියමි
ඔබගේ අභිමතය විලසින් ඒවා පවතින බව
කියමී

**ජේ.ඊ ජයසුන්දර**

# බාර්ණබස්

**ජාතිය** :- **යුදෙව්**
**ගෝත්‍රය** :- **ලෙවී**
**ගම් ප්‍රදේශය** :- **කුප්‍රසය**
**මුල් නම** :- **යොසෙප්**
**පසු නම** :- **බාර්ණබස් (අනුශාසනාවේ පුත්‍රයා)**
**සභාව** :- **යෙරුසලම් සභාව**

## බාර්ණබස්ගේ ජීවිතයේ විශේෂ අවස්ථා

● ඔහුගේ ජීවිතය හා සේවය ප්‍රේරිතයන් දැක ඊට අදාව බාර්ණබස් යන නම ලබා දීම (ක්‍රියා 4:36) - සභාව තුළ අප හැමටම ඉටු කිරීමට සේවයක් දෙවියන්වහන්සේ නියම කර ඇත. එය නියම අකාරයෙන් ඉටුකිරීමෙන් දෙවියන්යහන්සේගෙන් මෙන්ම මනුෂ්‍යයාලෙන්ද ප්‍රශංසාව ලැබේ.

● ඔහු සතු ඉඩමක් විකුණා දෙවියන්වහන්සේගේ සේවයට ලබා දීම (ක්‍රියා 4: 36)- අප සතු ධනය දෙවියන්වහන්සේගේය. ඒවා උන්වහන්සේගේ සේවයට පරිත්‍යාග කළ යුතු අතර එය සතුටු සිතින් කල යුතුය (2 කොරින්ති 9 : 7).

● පාවුල් ගැලවීම ලැබූ අලුත සභාවට ගෙන විත් ප්‍රේරිතයන්ට සාක්ෂි සහිතව හඳුනවාදීම (ක්‍රියා 9 : 27).- අපද අලුත් ඇදහිලවන්තයන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වා ඔවුන් ස්වාමීන්වහන්සේ හා සභාව තුල ස්ථිර කිරීමට උත්සුක විය යුතුය ( රෝම 15 : 1 )

● ඔහු යහපත් ,ශුද්ධාත්මයෙන් හා ඇදහිල්ලෙන් පූර්ණ වු මනුෂ්‍යයක් ලෙස ප්‍රසිද්ධ සාක්ෂියක් තිබු අතර අන් අයට අවවාද කිරීමට හැකි වන පරිදී ඉගැන්වීම දැන සිටියේය (ක්‍රියා 11: 22-24). අපත් යහපත් යැයි අදහිලිවන්කයන් අතරේ ප්‍රසිද්ධ සාත්ෂියක් ඇතුව සිටිම වැදගත් මෙන් දේව වචනයේ ඉගැන්වීම (ධර්මය) දැන සිටිම එමෙන්ම වැදගත්ය (2 තිමෝති 3:16).

● ඔහු පාවුල් සෙවීම උදෙසාම තාර්සස්ට ගොස් නැවත පාවුල් අන්තියෝකිය සභාවට ගෙන ආවේය ( ක්‍රියා 11:25).- අපද අධෛර්යට පත්වන හා සතුරාගේ පහරකෑමට හා ග්‍රහණයට හසු වන ඇදලිවන්තයන් පසුපස හඹා ගොස් ඔවුන්ට ධෛර්‍ය්‍ය දී උපකාර කොට නැවත ස්වාමීන්වහ්සේ හා සභාව වෙත ගෙන ආ යුතුය (රෝම 15:1).

● ඔහු අත වෙනත් සභාවලට අවැසී මුදල් යැවීය. (ක්‍රියා 11:30) - අපද මුදල් ගනු දෙනු සම්බන්ධයෙන් විශ්වාසවන්තව හා පිරිසුදුව ක්‍රියා කල යුතුය (නෙහෙමියා 13:13)

● ඔහු තමන්ට භාර දෙන ලද සේවය සම්පූර්ණ කරන ලදී ( ක්‍රියා 12 :25) - අපද අපට යේසුස්වහන්සේ පවරන ඕනෑම සේවයක් එය අවසානය දක්වා කළ යුතු අතර එය සම්පූර්ණ කල යුතුය. මොන බධා ආවත් එම වැඩය අවසන් කල යුතුය ( 2 තිමෝති 4:5).

● ඔහු දෙවියන්වහන්සේ විසින් විශේෂිත සේවයකට වෙන් කර ගැනීම (ක්‍රියා 13:1) - දෙවියන් වහන්සේ අපව එකිනෙකාට උන්වහන්සේගේ කැමැත්තේ ප්‍රකාරයට සේවය බෙදා දෙනසේක (1කොරොන්ති 11: 4-11).

● ඔහු සේවයේදී පිඩාවට මුහුණ දුනි. (ක්‍රියා 13:50)- අපට දෙවියන්වහන්සේට සේවය කිරීමේදී පීඩාවට මුහුණ දීමට තිබෙන අතර එය සතුටින් දරා ගත යුතුය (මතෙව් 5:11-12).

● ඉකෝනියේදි නිර්භිත ලෙස දෙවියන්වහන්සේගේ වචනය දේශනා කල අතර බොහෝ භාස්කර්මද කරන ලදි (ක්‍රියා 14 :1-4) - අපද යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචිය නිර්භිත ලෙස ප්‍රකාශ කල යුතු ය. එවිට ආත්ම ගැලවීම නැමැති භාස්කර්මය දෙවියන්වහන්සේ අප තුලින් ඉටුකරන සේක (යුද් 23).

● බාර්ණබස්ට සියුස් දෙවියා කියා නම් තැබීම(ක්‍රියා 14 : 12).- දෙවියන්වහන්සේට අවංකව හා ඇදහිල්ලේ බලයෙන් සේවය කරන විට මනුෂයන්ගේ ගෞරවදාරවය පත් වේ.

● ඔහු දෙවියන්වහන්සේගේ ගෞරවය තමන් වෙතට ලබා ගත්තේ නැත (ක්‍රියා 14:14) - අප සෑම විටම අපගේ සේවය තුලින් දෙවියන්වහන්ගේ නාමය ගෞරවයට පත්කල යුතුය.

● ඔහු සෑම සභාවක් පිළිබඳවම සිතේ බරකින් කටයුතු කලා. (ක්‍රියා 14:23).- අපද අප අයිති සභාව මෙන් අන් සභාද ස්වාමීන්වහන්සේට අයිති බව හා ඒ ගැන සිතේ බරකින් යාච්ඤා කිරිම වැදගත්ය.

● බාර්ණබස් අන් අය සමඟ එකඟ වීමට නොහැකි වාදකාරී තත්වයකදී ඉතා ප්‍රවේශමෙන් හා වගකීම් සහිතව ඉවසීමෙන් ක්‍රියා කලේය. (ක්‍රියා 15 :2)- අපද සේවයේ යෙදි සිටයදී ඇති වන ප්‍රශ්නකාරි

**11 වන පිටුව බලන්න.**

# බෞතීස්මය

බෞතීස්මයම යනු කිතුණු අපට ඉතා හුරු පුරුදු වචනයක් එමෙන්ම කිතුණු ඔබත් බෞතීස්මය ලබා තිබෙන්නට පුළුවන්. නමුත් කිතුණුවන් වන අප සියළුදෙනා සැබෑවටම බෞතීස්මයෙහි සැබෑ අර්ථය නිවැරදි ලෙස දැනගෙන සිටිනවාද යන්න සොයා බලමු. ප්‍රිය සහෝදර සහෝදරිය බෞතීස්මය කියන්නේ කීකරුවීමේ ලකුණක්, එනම් දේව වචනයට කීකරුවීමේ පියවරක්. දැනටමත් ඔබ තුල සිදුවෙලා තිබෙන්නාවූ දේ බාහිරව ප්‍රකාශකිරීමේ ලකුණක්ය.

## ඔබ මේ ගැන දන්නවාද?

බෞතීස්මය ලැබිය යුත්තේ තමන්ගේ පව්ගැන පසුතැවිලි වූ සියළු දෙනායි. එනම්, තමන්ගේ පව් කියාදෙමින් දෙවියන්වහන්සේ ඉදිරියේ පසුතැවිලි වෙමින්, ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වෙත ඇදහිල්ල තැබීම නම් බෞතීස්මය ලැබීමට සුදුකම් ලැබීමේ පළමු පියවරයි. පහත දේවවචන කොටස් කියවා බලන්න. **ක්‍රියා 2: 38 "නුඹලා සියල්ලෝම පසුතැවිලිව, පව්කමාව පිණිස, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් බෞතීස්මය ලබාපල්ලා. එවිට ශුද්ධාත්ම දීමනාව නුඹලා ලබන්නහුය". එලෙසම මාර්ක් 1: 5 "එවිට මුළු යුදා රටවැසීහුද, යෙරුසලමේ සියල්ලෝද ඔහු වෙතට පැමිණ තමන්ගේ පව්කියා දෙමින් ඔහුගෙන් යෝර්දාන් ගඟෙහි බෞතීස්මය ලැබුවෝය".**

## කිතුණුවන් මෙලෙස බෞතීස්මය ලබන්--නේ ඇයි? කිතුණුවන් බෞතීස්මය ලබන්නට අවශ්‍ය ඇයි?

### 1. ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්තහන්සේගේ අණයක්ව තිබෙන නිසයි.

මතෙව් 28: 19-20 එබැවින් නුඹලා ගොස් සියළු ජාතීන් ගෝලයන් කර පල්ලා. පියාණන්ගෙන් පුත්‍රයාණන්ගෙන් ශුද්ධාත්මයාණන්ගේන් නාමයට ඔවුන් බෞතීස්ම කරපල්ලා. මා විසින් නුඹලාට අණකල සියල්ලම පවත්වන්නට ඔවුන්ට උගන්වාපල්ලා.

### 2. එය දෙවියන්වහන්සේගේ මුළු මන්ත්‍රණයේ කොටසක්ම තිබෙන නිසයි.

දෙවියන්වහන්සේගේ මුළු මන්ත්‍රණය දේව වචනයෙහි ලියැවී තිබෙනවා. එලෙසම ක්‍රියා 20: 28හි පාවුල් තුමා දෙවියන්වහන්සේගේ මුළු මන්ත්‍රණය ප්‍රකාශ කල බව සඳහන් වෙනවා. එලෙසම දෙවියන්වහන්සේගේ මුළු මන්ත්‍රණයට ඇතුළු නොවූ පිරිසක් ගැන ලූක් 7: 30 පදයේ මෙසේ සඳහන්ව තිබෙනවා **"නමුත් ඵරිසිවරුද, ව්‍යවස්ථාව උගන්වන්නෝද ඔහුගෙන් බෞතීස්මය නොලැබ දෙවියන්වහන්සේගේ අදහස තමුන්ටම එපා කළෝය."**

### 3. එය පුරාණ අලුත් ගිවිසුම් සභාවේ ප්‍රායෝගික ව කල නිසා.

ක්‍රියා 2: 41 - **"එකල ඔහුගේ වචනය පිළිගත් අය බෞතීස්ම කරනු ලැබුවෝය. ඒ දවසේදී තුන්දහසක් පමණ මනුෂ්‍යයෝ ඔවුන්ට එකතු කරන ලද්දෝය."**

### 4. යේසුස්වහන්සේම බෞතීස්මවෙමින් ආදර්ශයක් තැබුවා.

යේසුස්වහන්සේට බෞතීස්මයක් අවශ්‍යය වුනේ නැහැ, උන්වහන්සේ පාප රහිත තැනැත්වහන්සේය. නමුත් සියළු මනුෂ්‍යයන් සමඟ එකත්වයට පැමිණීමට උන්වහන්සේ කැමතිව සිටිසේක. උන්වහන්සේ බෞතීස්මය ලැබීමට යොහන් වෙතට යෝර්දාන් ගඟ ළඟට පැමිණිසේක. නමුත් යොහාන් උන්වහන්සේ වලක්වමින් ඔබගෙන් බෞතීස්මය ලබන්නට මට යුතුව තිබියදී ඔබ මා වෙතට එන සේක්දැයි කීවේය. යේසුස්වහ්න්සේ ඔහුට උත්තර දෙමින්: දැනට ඉඩහරින්න. මක්නිසාද මෙසේ සියළු ධර්මිෂ්ඨකම් සම්පූර්ණ කරන්ට අපට සුදුසු යයි කීසේක (මතෙව් 3: 13-15).

දේව වචනයෙහි සඳහන් වන බෞතීස්මයට සම්බන්ධ සිද්ධීන් දෙකක් ගැන විමසා බලමු. ඉන් පළමු සිද්ධිය නම් ක්‍රියා 8 වන පරිච්ඡේදයේ සඳහන් ඉතියෝපියානු නපුංසකයා ගැන සඳහන් විස්තරයයි. ක්‍රියා 8:26-40 කියවන්න. පිලිප් නම් ඉවැනජලිස්තවරයා සමාරියෙහි ශුභාරංචි සේවය කරමින් සිටියේය. දෙවියන්වහන්සේ ඔහුට කතාකර සමාරියෙන් පිටතට ඇවිත් ගාසා තීරයට යන ලෙස ඔහුට කීසේක. ඒ (27 වෙහි පදයට අනුව)

නමස්කාරකරන පිණිස යෙරුසලමට ගොස් නැවත ඉතියෝපියාව බලායන ඉතියෝපියාවේ බිසවගේ මුළු වස්තුවේ භාණ්ඩාගාරිකවූ නපුංසක මනුෂ්‍යයකුට කතා කරන පිණිසය. ඔහු තමාගේ රථයේ හිඳ යෙසායා අනාගතවක්තෘතුමාගේ පොත කියාවගෙන ගියේය. 32වන පදයට අනුව ඔහු කියවගෙන ගිය කොටසනම් **"උන්වහන්සේ බැටළුවෙකු මරණයට ගෙනයනු ලැබ, බැටළු පැටවෙකු උගේ ලෝම කපන්නා ඉදිරිපිට ගොළුව සිටින්නාමෙන් තමන් මුඛය නාරින සේක**...ම පිලිප් මෙම මනුෂ්‍යයාගේ රථය සමඟ එකතුව රථයට නැග ඔහුට එම ලියවිල්ලෙන් පටන්ගෙන යේසුස්වහන්සේව දේශණාකල බව 35වන පදයෙහි සඳහන්වේ. යේසුස්වහන්සේ විශ්වාස කල මෙම ඉතියෝපියානු මනුෂ්‍යයා ජලාශයක් දුටුවිට තමන් බෞතීස්ම වීමට වලක්වන්නේ කුමක්දැයි ඇසුවේය(36 පදය) පිලිප් බෞතීස්ම වීමට නුඹ නුඹේ මුළු හිතින් අදහන්නෙහිනම් එසේ පුළුවනැයි කීය.

පසුව ඔහු බෞතීස්මය ලැබ ප්‍රීතියෙන් ගෙදර ගිය බවද දේව වචනයෙහි සඳහන් වෙයි.

දෙවැනි සිද්ධිය ලෙසින් ක්‍රියා 16වෙනි පරිච්ඡේදයේ සඳහන් පිලිප්පියේ හිරගෙදර මුලාදෑනියා ගැන සඳහන් විස්තරයයි. (ක්‍රියා 16: 19-40 කියවන්න) පාවුල් සහ සීලස්ට අසාධාරණ ලෙස පහරදී සිරගෙට දැමුවේය. ඔවුන් ලැබූ පහරදීම් නිසා ශරීරයෙන් ලේ ගලමින් තිබූ බව 22 පදයේ සඳහන් වෙනවා. එලෙසම ඔවුන්ගේ පාදවලට විගංගු දමා තිබුණේය. නමුත් පාවුල් සහ සීලස් මධ්‍යම රාත්‍රිය දක්වා යාච්ඥාකරමින් දෙවියන්වහන්සේට ගීකිව්වෝය. හදිසියෙන් ඇතිවූ භූමිකම්පාවක් නිසා හිරගෙයි දොරවල් ඇරී රැඳවියන්ගේ දම්වල් බිඳී ගිය අතර මෙය දුටු හිරගෙයි මුලාදෑනියා තමාම මරා ගන්නට උත්සහකල නමුත් පාවුල් තුමා ඔහු වැලැක්වූවේය (23-28 පද). මෙම මුලාදෑනියා පාවුල්තුමාගෙන් ගැලවෙන පිණිස තමන් කලයුතු දේ කුමක්දැයි ඇසුවේය.

**"ස්වාමිවූ යේසුස්ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි අදහාගනින්න, එවිට නුඹ ගැලවෙන්නෙහිය, නුඹත් නුඹේ ගෙයිවැසියෝත් එසේමයයි කීවෝය"** (31 පදය) පාවුල්තුමාගේ පිළිතුරින් පසු ඒ රැයේම දේවවචනය ඇසූ ඔවුන් දෙවියන්වහන්සේට කීකරුවෙමින් බෞතීස්මය ලැබුවෝය. 34 වන පදයට අනුව ඔහු තමාගේ ගෙයිවැසි සියල්ලන් සමඟ දෙවියන්වහන්සේ අදහමින් බොහෝසේ ප්‍රීතිවූයේය.

මෙලෙස, යේසුස් වහන්සේ අණකල දෙවියන්වහන්සේගේ මුළු මන්ත්‍රණයේ කොටසක්ව තිබෙන, අලුත් ගිවිසුම් සභාවේ කරන සහ යේසුස්වහන්සේ වූ බෞතීස්මයේ අර්ථය ගැන දැන ගැනීම මෙම ලිපිය කියවන ඔබට මේ සත්‍යයතාව තේරුම් ගැනීමට ප්‍රයෝජනවත් වේ යැයි විශ්වාසකරමි.

## එසේනම්, මේ බෞතීස්මයේ අර්ථය කුමක්ද?

ඔබේ පරණ ස්වභායට, පරණ පාපයට ඔබ මැරුණා යන්නයි. නුමුත් ඔබ අලුත් ජීවිතයකට නැගිටුවා තිබෙනවා. එනම් ක්‍රිස්තුස්වහන්සේ සමඟ මරණයට පත්වී, ක්‍රිස්තුස්වහන්සේ උදෙසා අලුත් ජීවිතයකට ක්‍රිස්තුස්වහන්සේ සමඟ නැගිටුවා තිබෙන බවයි.

වතුර තුලට බැසයාමෙන්, මගේ පරණ ජීවිතය, පරණ පුරුදු, පරණ හැසිරීම් දැන් මැරී, වලලනු ලැබීමත් වතුරෙන් ගොඩට පැමිණීමෙන්, අලුත් ජීවිතයකට ඔබ නැගටීම යයි ඔබ ප්‍රකාශකරනවා. **"මම ක්‍රිස්තුස්වහනසේ සමග කුරුසියෙහි ඇණගසනු ලැබ සිටිමි. එසේවී නමුත් මම ජීවත්වෙමි. නමුත් මා නොව ක්‍රිස්තුස්වහන්සේ මා තුල ජීවත්වනසේක"... (ගලාති 2: 20)**

තවත් විශේෂ කරුණු දෙකක් මෙම ලිපියෙන් ඔබට ගෙනහැර දක්වන්නට මම බලාපොරොත්තු වෙමි. එනම් ගැළවීම ලැබුවිට ඔබ නොදැනුවත්වම මෙම කාරණා දෙක අභිරස් ලෙස ඔබ තුල සිදුවෙනවා.

1. ක්‍රිස්තුස්වහන්සේගේ මරණයට ඔබ බෞතීස්ම කරනු ලබනවා. වතුර තුලට බැසයාමෙන් මෙම කාරණය ප්‍රකාශ කරනවා. ක්‍රිස්තුස් යේසුස්වහ්නසේ තුලට බෞතීස්ම ලැබුවාවූ අප සියල්ලන් උන්වහන්සේගේ මරණයට බෞතීස්ම ලැබූ බව නුඹලා නොදැන සිටින්නහුද (රෝම 6: 3).

2. ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය තුලට අප බෞතීස්ම කරනු ලබනවා.

ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය නම් සභාවට එනම් මේ විශ්ව සභාව තුලට අප බෞතීස්ම කර තිබෙනවා. මෙය, බෞතීස්මයෙන් පසු අත්තැබීමෙන් ප්‍රකාශකරනු ලබනවා. **"අප සියල්ලෝ එකම ආත්මයාණන්වහන්සේ තුල එකම ශරීරයට බෞතීස්ම කරනු ලැබ, සියල්ලෝ එකම බෞතීස්මයෙන් පොවනු ලැබීමුව" (1 කොරින්ති 12: 13).**

සහෝදර සහෝදරියනි, ඔබ පරීක්ෂාවට ලක්වන සෑම මොහොතකම දෙවියන්වහන්සේගේ ඔබ ලැබූ ධෛර්ය, නිර්භීතකම හා ප්‍රීතිය මතක් කර ගන්න. යක්ෂයා ඔබව අල්ලා ගැනීමට ඔහුගේ සෑම උපායක්ම යොදමින් සිටිනවා. මේ සෑම පරීක්ෂාවන් ජය ගැනීමට දේව වචනය ඔබේ හදවතේ දරා ගන්න. යක්ෂයා යේසුස්වහන්සේව පරීක්ෂාකරන විට උන්වහන්සේ පාප රහිතව ජය ගත් සේක. ඒ දේව වචනය කරණකොටගෙන බව මතක තබාගන්න. **"මනුෂ්‍යයා දෙවියන්වහන්සේගේ මුඛයෙන් නික්මෙන සියළු වචනවලින් ජීවත් වෙනවා මිස රොටි පමණකින් ජීවත් නොවන්නේය කියා ලියා තිබේයැයි කීසේක" (මතෙව් 4: 4).** පරීක්ෂාව ඉවසන්ට, ඒ තුලින් යන්ට සහ එයින් ජය ගන්නට දෙවියන්වහන්සේ ඔබට පොරොන්දුවක් ලබා දෙනවා. 1 කොරින්ති 10: 13 කියවන්න.

ප්‍රිය සහෝදර සහෝදරියනි, අවසාන වශයෙන් ඔබ ඉදිරියෙන් අභියෝග දෙකක් තබන්නට කැමැත්තෙමි. එනම්,

**1. ජයගන්නෙක් වෙන්න/ පාපය ජයගන්නෙක් වෙන්න**

එළිදරව් 12: 11 - "ඔවුහු බැටළුපැටවාණන්ගේ ලේ නිසාද තමුන්ගේ සාක්ෂියේ වචන නිසාද ඔහුගෙන් ජය ගත්තෝය".

1 යොහන් 4: 4 - "ලෝකයෙහි සිටින තැනැත්තාට වඩා නුඹ තුල සිටින තැනැත්වහන්සේ උතුම් බැවින් නුඹලා ඔවුන්ගෙන් ජය ගෙන සිටින්නෝය".

**2. දෙවියන්වහන්සේගේ දරුවන් සමඟ සහභාගිකම් පැවැත්වීම.**

වරක් අපි දෙවියනවහන්සේගේ දරුවන් නොවුවත් දැන් උන්වහන්සේගේ දරුවන්ව සිටිනවා. වරක් අපි කරුණාව නොලැබ සිටියත් දැන් කරුණාව ලැබී සිටිනවා. නපුරාගෙන් ආරක්ෂා වී සිටින්නන්ට දෙව දරුවන් සමඟ සහභාගිකම් පවත්වන්න. ප්‍රිය සහෝදර සහෝදරිය, දේව වචනයට කීකරුවීමෙන් දෙවියන්වහන්සේගෙන් වූ ප්‍රීතියේ පංගුකාරයෙකුවෙන්ටත්, අභියෝග ජය ගන්ටත්, දේවියන්වහන්සේගේ ධෛර්ය හා නිර්භීත කම ඔබ සියළු දෙනා සමඟ වේවා!

**ටෝනි පෙරේරා - (දේශනාවක් ඇසුරෙන් සකසන ලදී-ශාමිලා වාසනා)**

## 7 වන පිටුවෙන් - මෙය විශ්වාස.....

සහ සුභාරංචිකරුවන් විසින් කෙරූ දේශනාවලට සවන්දෙමින් දේව සේවකයින් සමඟ සහභාගිකම් පවත්වමින් දෙවියන්වහන්සේගේ ප්‍රේම පණිවිඩයේ සත්‍යතාවය අවංකව තේරුම්ගෙන ස්වාමිවූ යේසුස්ක්‍රිස්තුස්වහන්සේව මගේ පුද්ගලික ගැලවුම්කරුවාණන්වහන්සේ ලෙස සැබෑ ලෙසින්ම මගේ සිතට පිළිගත්තෙමි. සැබවින්ම මගේ හදවතේ දොර විවෘත කර, අපගේ ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානයෙහි පැවැත්වූ සුභාරංචි රැස්වීම අවසානයේදී අත ඔසවා පෙන්නුවාය. එදින, මා සමඟ ජීවත්වීමට ස්වාමීන්වහන්සේ මගේ සිතට පැමිණි අතර උන්වහන්සේගේ ශුද්ධාත්මයාණන්වහන්සේව මා සමඟ සිටීමට පැමිණි සේක. කිසිසේත් නුඹෙන් අහක්ව නොයමි, නුඹ අත් නොහරිම්යිම යැයි කීසේක. එවෙලේ පටන්, මම වෙනස් වුනේය. මගේ සෑම ක්‍රියාවල්වලදිම ස්වාමීන්වහන්සේටත් උන්වහන්සේගේ අණ පණත්වලටත් ප්‍රේම කෙළෙමි. ප්‍රධානව දෙවියන්වහන්සෙටත් යේසුස්වහන්සෙටත් ශුද්ධාත්මයාණන්වහන්සේටත් ප්‍රේම කරන්ටත් ශුද්ධ ලියවිලිවල ඇති උපදෙස් පිලිපදින්ටත් මගේ ආත්මයද ප්‍රාණයද සහ ශරීරයද යොමු කළෙමි. මගේ පුද්ගලික සේවයනම් මට මෙන් මගේ අසල්වැසියාට ප්‍රේම කරමින් යේසුස්වහන්සේගේ පැමිණීම තෙක් නිශ්චලව සිටීමයි. මෙයයි මගේ ප්‍රීතිය. මක්නිසාද, උන්වහන්සේ සමඟ සිටීමට මම ගියවිට ස්වාමීන්වහන්සේ මට මගේ නිධානය නොහොත් තෑග්ග දෙන බව මම දනිමි, ස්වාමීන්වහන්සේට එක දවසක් අවුරුදු දහසක් මෙන්ය, අවුරුදු දහසක් එක දවසක් මෙන්ය.

**මම රෙජිනෝල්ඩ් ජෝන්**

# උපාලි නන්දන ඉදිරිපත් කරන

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | ■ | 4 | | 5 |
| 6 තා | | | 7 | ■ | ■ | |
| | ■ | ■ | 8 | | ■ | |
| 9 | | 10 | | ■ | 11 | ■ |
| | ■ | | ■ | 12 ක | ■ | 13 |
| ■ | 14 | | ■ | | ■ | |
| 15 | | ම් | ■ | 16 | | |

## ප්‍රහේලිකාව

**හරහට**

1 මට මාරා යයි කියන්න කීවේ මැයටය.
4 ගැලවීම නොලත් අය මෙහි වේදනා විදියි.
6 නවාතැන.
8 මණ්ඩපය සෑදීම සඳහා මෙවැනි දේ දුන්නේය.
9 මොහු නමින් බයිබලයේ පොතක් ඇත.
11 යේසුස් වහන්සේ වැගුරූ ______ .
14 මව යන්නට විරුද්ධ පදයකි.
15 ස්ත්‍රීන්ට මේවා බොහෝ ඇතැයි කියවේ.
16 ඉශ්‍රායෙල්ට පර්වතයෙන් වතුර දුන් ස්ථානයට මේ නම තැබිනි.

**පහළට**

1 මොහු තුළ කිසි වංචාවක් නැතැයි යේසුස් වහන්සේ කී සේක.
2 අමිත්තයි ගේ පුත්‍රයාය.
3 නෝවා සෑදූ නැවට ඇතුල් නොවූ සියලු දෙනා ______ ගියෝය.
5 සෑම දෙනාම පාපයෙන් ගලවන්නට පුළුවන් එකම තැනැත්වහන්සේ.
7 මාර්තා ගේ සහෝදරියයි.
10 මෝසස්ට විරුද්ධව කථා කර දඬුවම් ලැබූ ස්ත්‍රියයි.
12 යහපත් යන අදහස ගෙන දේ.
13 පළවෙනි විනිශ්චකාරයාගේ භාර්යාවයි.
14 මෙය උතුම් පදවියකි.

ප්‍රිය දරුවනි,
මෙවර කලාපයේ ළමා පිටුව පළනොවේ.
ඒ පිළිබඳ කණගාටුව ප්‍රකාශ කරමි
**- සංස්කාරක**

## 2015 ඔබ සැමට ආශීර්වාදවත්
## නව වසරක් වේවා

## ඔබ සැමට සුභද ආරාධනා

''2015 නව වසර උදා වීමේ මෙහෙය''

දෙවියන් වහන්සේගේ පාද පාමුල
නව වසරට පා තැබීමට ඔබත් කැමැතිද?
එසේ නම් අප හා එක්වන්න

2014 දෙසැම්බර් 31 වෙනිදා රාත්‍රී 10.00 සිට
ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානයේදී......

ඔබත් පැමිණ ආශිර්වාද ලබා ගන්න
දේව වචනය පොරොන්දු සමගින් උන්වහන්සේ අත්දකින්න.
දේව දරුවන් සමග සහභාගීකම අත්දකින්න.
ක්‍රිස්තුස් යේසුන්වහන්සේගේ බලය සමග නව වසරේ අභියෝග
වලට මුහුණ දීම සඳහා නව බලාපොරොත්තු ලබා ගන්න.



පිවිසෙන්න අපේ වෙබ් අඩවියට
www.christianfellowshipcentre.com